



1946 - 2016

එක්සත් ජාතික පක්ෂය

ஐக்கிய தேசிய கட்சி | United National Party

# සංවත්සර සම්මේලනය

**2016-09-10**

1946 - 2016

එක්සත් ජාතික පක්ෂය

ஐக்கிய தேசிய கட்சி | United National Party

# සංවත්සර සම්මේලනය

**2016-09-10**

The Inaugural Meeting of the United National Party was held on Friday, 6th September, 1946 at 5 p.m. at Palmcourt, Albert Crescent.

Hon'ble Col: J.L.Kotalawala who was Convenor welcomed the members and read the letter convening the Meeting. He then invited Hon'ble Mr. D.S.Senanayake to occupy the Chair.

Hon'ble Mr. D.S.Senanayake took the chair and addressed the Meeting and explained the aims and objects of the Party. He also emphasised the importance and the need for unity among all communities residing in the Island. He also appealed for goodwill and mutual trust and expressed the hope that the United National Party will be a strong political force in the country and will play a great part in moulding the future destinies of the people.

The following resolution "That this Meeting resolves to form a Political Party to be called the United National Party" was moved by Mr. S. Natesan, M. S. C. and seconded by Mr. T. B. Jayah, M.S.C. The resolution was put to the House and was carried unanimously.

The next resolution "That this Meeting adopts the Manifesto and Constitution of the Party" was moved by Mr. A. F. Molamure, M.S.C and seconded by Mr. A. R. A. Razik, M.S.C. The resolution was put to the House and was carried unanimously.

Then followed the election of Office bearers. Hon'ble Mr. D.S. Senanayake vacated the chair and Hon'ble Mr. S.W.R.D.Bandaranaike occupied the chair pro tem and after delivering a short address, proposed the name of Hon'ble Mr. Senanayake as Chairman of the Party. Hon'ble Mr. George E. de Silva seconded and was carried unanimously. Hon'ble Mr. Senanayake proposed from the chair the election of Messrs. Bandaranaike, Kotalawala, George E. de Silva, A. Mahadeva and T. B. Jayah as Vice-Chairmen and this was carried unanimously. Hon'ble Mr. Senanayake proposed the name of Mr. H.W.Amarasuriya as Honorary General Secretary and Messrs. A.R.A.Razik and J.R.Jayawardene as Honorary Joint Treasurers. This was carried unanimously.

The Meeting terminated with a vote of thanks to the Chair proposed by Dr.V.R.Schokman and seconded by Dr.L.A.Rajapakse, K.C.

1946 සැප්තැම්බර් 6 දින පැවැති එක්සත් ජාතික පක්ෂයේ සමාරම්භක රැස්වීමේ වාර්තාව

## මහලේකම්තුමාගේ වාර්තාව

### අපි

අඩසියවසක් තුළ, අපේ රටට සහ ජනතාවට විශිෂ්ට නායකත්වයක් දෙමින් රටේ සමාජ ආර්ථික ප්‍රගතියට අනුපමේය සේවයක් කළ එක්සත් ජාතික පක්ෂය, විචිත්‍ර හා ස්ථාවර ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ ප්‍රබලතම තනි දේශපාලන පක්ෂය යි.

එක්සත් ජාතික පක්ෂය ආරම්භ කිරීමෙහිලා පුරෝගාමී වූයේ ගරු ඩී.එස්. සේනානායක මැතිතුමා ය. මෙයට හරියට ම අඩසියවසකට පෙර, එනම් 1946 සැප්තැම්බර් 6 වැනි දා, කොළඹ ඇල්බට් චන්ද්‍රවංකයේ, පාම්කෝට් මන්දිරයේ රැස්වී එක්සත් ජාතික පක්ෂය පිහිටුවා ගනිමින් එතුමන් විසින් කරන ලද සමාරම්භක ප්‍රකාශනයෙහි මෙසේ සඳහන් ය.

"මේ දේශයට පිරිනමා තිබෙන පාලන ව්‍යවස්ථාවට අනුව, ස්ථිරසාර වූත්, විනයගරුක වූත්, බහුතරයකගේ සහයෝගය ලබන ප්‍රබල ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ ය. ඒ අනුව ප්‍රබල පක්ෂයකුත් අවශ්‍ය වූයේය. විරුද්ධ පක්ෂය සිතන ආකාරයට අපේ පක්ෂය පළමු මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීම සඳහා කඩිනමින් පිහිටුවා ගත් තාවකාලික හවුලක් නොවේ. අපේ පක්ෂය වූකලී නියෝජිත මන්ත්‍රණ සභාවේ දී පාලක පක්ෂය වශයෙන් හෝ විරුද්ධ පක්ෂය වශයෙන් හෝ ව්‍යවස්ථානුකූල ප්‍රතිපත්ති අනුව ක්‍රියාකරනු පිණිස සකස් කරන ලද ස්ථාවර සංවිධානයකි."

එක්සත් ජාතික පක්ෂය, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම එක්සත් වූත්, ජාතික වූත් සංවිධානයකි. මක්නිසාද යත්, මෙම පක්ෂය සකස් වී තිබෙන්නේ දේශයේ ජන කොටස් සියල්ල ම නිසි සේ නියෝජනය කෙරෙන ආකාරයෙන් හෙයිනි.

විය යුතු පරිදි ම, මේ එක්සත් ජාතික පක්ෂයේ සමාරම්භක සභාපති පදවිය පැවරුනේ ගරු ඩී.එස්. සේනානායක මැතිතුමාට ය. ජාතියේ ඉරණම භාරව සිටි ශ්‍රේෂ්ඨ නියමුවකු වූ දේශමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා රටේ අනාගත ශුභසිද්ධිය පිළිබඳ දූරදර්ශී අවධානයකින් යුක්ත ව, පක්ෂය සංවිධානය කළේය. එතුමාට, ඒ සමාරම්භක අවධියේ දී සිය සහයෝගය සැපයූ පක්ෂයේ පුරෝගාමී නිලධාරී මඩුල්ල මෙසේ ය:



**උප සභාපතිවරු** : එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, ටී.බී. ජයා, අරුණාචලම් මහාදේව, එස්. නටේසන්, ජේ.එල්. කොතලාවල සහ ජෝර්ජ් ඊ ද සිල්වා. **සම භාණ්ඩාගාරිකවරු** : ඒ.ආර්.ඒ. රසීක්, ජේ.ආර්. ජයවර්ධන. **ලේකම්** : එච්. ඩබ්ලිව්. අමරසූරිය.

පනස් වසරකට පෙර සාමාජිකයින් 205 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පිහිටුවා ගත් එක්සත් ජාතික පක්ෂයේ අද සාමාජික සංඛ්‍යාව ලක්ෂ තිහකට අධිකය.

අනුක්‍රමයෙන් විකාශනය වෙමින් ආ, එක්සත් ජාතික පක්ෂය, ඉකුත් අඩසියවසින් වසර තිස් එකක් ම, රටේ පාලනය භාර ව සිටියේ ය. ඉතිරි දහනව වර්ෂය තුළ දී විපක්ෂයෙහි සිටිමින්, එක්සත් ජාතික පක්ෂය, රට ප්‍රගති මාර්ගයෙහි ගමන් කරවීමෙහිලා තමන් සතු වගකීම, නොඅඩුව ඉටු කළේය.

අතීතාවර්ජනයෙහි යෙදී මේ දේශයේ ඉතිහාසය විමසීමේ දී එක්සත් ජාතික පක්ෂය විසින්, ශ්‍රී ලංකාවට නිදහස දිනා දීමෙන් ඉටු කරන ලද මාහැඟි ජාතික සේවය තහවුරු වන්නේය. එය එක්සත් ජාතික පක්ෂය ඉටු කළ ප්‍රථම ජාතික මෙහෙවර යි. 1948 දී ශ්‍රී ලංකා මාතාවට නිදහස් කිරුළ පළන්දවාලූ එක්සත් ජාතික පක්ෂය, ඉනික්බිති ව රටට නැති ව ම බැරි ආර්ථික නිදහස දිනාදීමේ මහා කාර්යයට උර දුන්නේ ය. ඒ සමඟ ම, මේ දේශයේ සියලු ජනතාවට සමාජ සාධාරණත්වය ඉටු කරලීමේ භාරදූර කාර්යයටත් එළැඹුණේය.

එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකාව නිදහස දිනාගැනීමෙන් පසුව අඛණ්ඩ ව පාර්ලිමේන්තුවෙහි නියෝජනය වුණු එක ම පක්ෂය ද වෙයි.

නිදහසින් පසු පැවැති සෑම මැතිවරණයක් ම තරග කළ එක ම පක්ෂය ද එක්සත් ජාතික පක්ෂය වෙයි.

මෙසේ දේශපාලන ක්ෂේත්‍රයෙහි විවිධ වූ විශිෂ්ට වාර්තා නැංවූ එක්සත් ජාතික පක්ෂය විසින් ශ්‍රේෂ්ඨ ජන නායක පරපුරක් ද බිහි කරන ලදී.

# ඩී.එස්.




එක්සත් ජාතික පක්ෂයේ ආරම්භයෙහි පටන් පක්ෂ නායකත්වය උසුලන ලද්දේ ඩී.එස්. සේනානායක මැතිතුමා විසිනි.

1947 වර්ෂයේ දී එක්සත් ජාතික පක්ෂය මහා මැතිවරණයට මුහුණ දුන්නේ ඩී.එස් සේනානායක මැතිතුමාගේ නායකත්වයෙනි. එහි දී ඡන්ද හත්ලක්ෂ පනස් එක්දහස් හාරසිය තිස් දෙකක් ලබාගෙන ජයග්‍රහණය කළ එක්සත් ජාතික පක්ෂය විසින් අත්පත් කොටගත් ඡන්ද ප්‍රතිශතය 39.8 කි. මෙම මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 42 ක් තේරී පත් වූහ.

එක්සත් ජාතික පක්ෂය පිහිටුවා රටත්, ජනතාවත් බ්‍රිතාන්‍ය යටත් විජිතවාදයේ ග්‍රහණයෙන් මුදාගෙන, ජාතියේ නිදහස උදාකොට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් අපට දායාද කළ ගරු ඩී.එස් සේනානායක මහතා 1952 මාර්තු 22 දා අභාවප්‍රාප්ත වූයේය.

## ඩඩ්ලි



එතුමාගේ අභාවයෙන් හිස් වූ එක්සත් ජාතික පක්ෂ නායකත්වයට පත් වූයේ ඩඩ්ලි සේනානායක මැතිතුමාය. පක්ෂ නායකත්වයත් අගමැති පදවියත් ලද ඩඩ්ලි සේනානායක මැතිතුමා, 1952 දී පාර්ලිමේන්තුව විසුරුවා හැර, මහා මැතිවරණයක් පැවැත්වූයේය.

එහිදී එක්සත් ජාතික පක්ෂය, ඡන්ද දශලක්ෂ විසිහය දහසක් ලබාගෙන 1947 දී ලද ප්‍රතිශතයට වඩා පහකින් වැඩි ඡන්ද ප්‍රමාණයක් ද ලබාගත්තේය. මෙම මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 54 ක් තේරී පත් විය. මෙය පක්ෂයක් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ලැබූ ප්‍රථම අවස්ථාව විය. එහෙත්, 1953 දී ඩඩ්ලි සේනානායක මැතිතුමා, සෞඛ්‍ය හේතු නිසා අගමැති පදවියෙන් ද පක්ෂයේ නායකත්වයෙන් ද ඉල්ලා අස්වූයේය.

## සර් ජෝන්



එක්සත් ජාතික පක්ෂයේ තෙවන නායකයා වශයෙන් පදවි ප්‍රාප්ත වූයේ ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා යි. ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමාගේ නායකත්වය යටතේ, 1956 දී මහමැතිවරණයකට මුහුණ දුන් එක්සත් ජාතික පක්ෂයට අන්ත පරාජයකට මුහුණ පාන්නට සිදු වූයේය.

එහෙත් 1956 මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය ප්‍රථම වතාවට ඒකාබද්ධ විරුද්ධ පක්ෂ බලවේගයට මුහුණ දුන්නේ ය. එවර අප පක්ෂයට හිමිවූයේ ඡන්ද හත්ලක්ෂ තිස්අටදහස් හත්සිය පනස් හතකි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 8 දෙනෙක් තේරී පත්වූහ. 1956 පරාජයෙන් පසු ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා පක්ෂ නායකත්වයෙන් ක්‍රමයෙන් ඉවත් විය.

## පක්ෂයට පුනර්ජීවයක්

මෙම පරාජයෙන් පසු පක්ෂයේ ප්‍රතිසංවිධාන කාර්ය භාරය ජේ.ආර් ජයවර්ධන මැතිතුමාට පැවරිණි. කවර පරාජයක දී හෝ වේවා, අධෛර්යයට පත් නොවී, නව ශක්තියකින් අභියෝගවලට මුහුණ පෑමට සමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා 1956 පරාජයෙන් පසුබට නොවී එක්සත් ජාතික පක්ෂය යළි පණ ගන්වන්නට අප්‍රතිහත ධෛර්යකින් කටයුතු ආරම්භ කළේය.

ජේ.ආර් ජයවර්ධන මැතිතුමා විසින් ක්‍රියාවේ යොදන ලද දැවැන්ත ප්‍රතිසංවිධානයේ ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵලය වූයේ 1956 අන්ත පරාජයෙන් හත්මසකට පසු - එනම් 1956 දෙසැම්බර් 19 දා පැවති කොළඹ නාගරික මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට විශිෂ්ට ජයග්‍රහණයක් අත්පත් කොට ගත හැකිවීමයි.

# නැවතත් ඩඩ්ලි



ඉන්පසු 1958 දී එක්සත් ජාතික පක්ෂ නායකත්වය යළිත් ඩඩ්ලි සේනානායක මහතාට පැවරිණි. ඒ මහතාගේ නායකත්වයෙන් 1960 මාර්තු මස මහ මැතිවරණයකට මුහුණ පෑ එක්සත් ජාතික පක්ෂයට ඡන්ද නවලක්ෂ අටදහස් නවසිය අනූහයක් ලැබිණි. තේරී පත් වූ මන්ත්‍රී සංඛ්‍යාව 50 කි.

ඩඩ්ලි සේනානායක මැතිතුමා විසින් 1960 මාර්තු මාසයේ දී පිහිටුවන ලද බහුතරයක් නොමැති ආණ්ඩුව පාර්ලිමේන්තුවේ රාජාසන කතා විවාදයේ දී පරාජයට පත්විය.

අනතුරුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු 1960 ජුලි මස පැවති මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය නැවත පරාජයට පත්විය. ඒ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය දිනාගත් මන්ත්‍රී සංඛ්‍යාව ආසන 30 ක් වුව ද පක්ෂයට ලැබුණු ඡන්ද සංඛ්‍යාව එකලොස් ලක්ෂ හතලිස් තුන්දහස් දෙසීය අනූවක් විය. එය 60 මාර්තුවේ ලද ඡන්ද සංඛ්‍යාවට වඩා ලක්ෂ එකහමාරක වැඩිවීමකි.


1964 වර්ෂයේ දී ශ්‍රී ලංකා - සමසමාජ - කොමියුනිස්ට් සභාග රජය විසින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේ පනත පාර්ලිමේන්තුව හමුවට පමුණුවන ලදී. ඒ පනත සම්බන්ධයෙන් ඇති වූ අර්බුදයක දී එක්සත් ජාතික පක්ෂය විසින් එම සභාග රජය පරාජය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1965 දී පැවැත්වුණු මහ මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළේය.



1965 මහ මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය ලැබූ ඡන්ද සංඛ්‍යාව පසලොස්ලක්ෂ හැත්තෑ නවදහස් එකසිය අසූඑකකි. දිනාගත් මන්ත්‍රී සංඛ්‍යාව 66 කි. මෙවර පක්ෂයට ලැබුණු ඡන්ද සංඛ්‍යාව පෙර වතාවට වඩා (1960) ලක්ෂ හතරකින් වැඩි විය.

1970 මහමැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය යළිත් පරාජයට පත්වූයේය. එහි දී එක්සත් ජාතික පක්ෂය ලැබූ ඡන්ද සංඛ්‍යාව දහඅටලක්ෂ හැත්තෑ හත්දහසකි. එවර ද 1965 දීට වඩා ඡන්ද තුන් ලක්ෂයක් පක්ෂයට ලබාගත හැකි විය. දිනාගත් මන්ත්‍රී සංඛ්‍යාව 17 කි.

# ජේ.ආර්.



පක්ෂ නායක ඩඩ්ලි සේනානායක මැතිතුමා, 1973 අප්‍රේල් මාසයේ දී අභාවයට පත් විය. ඒ මහතාගේ ඇවෑමෙන්, එක්සත් ජාතික පක්ෂයේ සිව්වන නායකයා බවට පත්වූයේ විපක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ය.

එම පදවියට පත්වූ තැන් පටන් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පක්ෂයට නව ජීවයක් ලබා දුන්නේ ය. පක්ෂ නායකයා වශයෙන් තමන් සතු වගකීම නිසි ලෙස ඉටු කළ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, පක්ෂය ප්‍රතිසංවිධානය කළේ පෙර නොවූ විරූ ලෙසිනි.

මේ පක්ෂ සංවිධානයේ ප්‍රධාන අරමුණක් වූයේ මෙතෙක් අවධානයට ලක් නොවූ කණ්ඩායම්වලට නිසි තැන ලබාදීමයි. ඒ ප්‍රතිපත්තියට අනුව තරුණ කණ්ඩායම් කෙරේ තියුණු සැලකිල්ලක් දැක්විණි. පෙරට වඩා ක්‍රමවත් ලෙස වෘත්තීය සංගම් ශක්තිමත් කිරීමේ ක්‍රියාදාමයක් ඇරඹිණි. අප රටේත්, ලෝකයේත්, වෙනස් වෙමින් පැවැති දේශපාලන හා සමාජ ආර්ථික රටාවට අනුකූල පක්ෂ ප්‍රතිපත්ති මාලාවක් ද සැලසුම් කළේය.

රටේ විවිධ ප්‍රදේශවල පිහිටි කාන්තා සංවිධාන ශක්තිමත් කොට ඒවාට නව ප්‍රබෝධයක් දීමේ දීපව්‍යාප්ත ව්‍යාපාරයක් ඇරඹුයේය.


නව නායකත්වය යටතේ පක්ෂය විසින් ගෙන ගිය වැඩපිළිවෙළක් වූයේ පාර්ලිමේන්තුවේ දී මෙන්ම, පාර්ලිමේන්තුවෙන් බැහැර දීත්, රජයට අවස්ථානුකූල ව අභියෝග ඉදිරිපත් කිරීම යි. හදිසි නීතිය යටතේ එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම් තහනම් කිරීමට රජය පියවර ගත්තේ ද මේ වකවානුවේදීය.



1975 දී ශ්‍රී ලංකා - සමසමාජ - කොමියුනිස්ට් සභාග රජය මගින් පාර්ලිමේන්තු කාලසීමාව තවත් අවුරුදු දෙකකින් දීර්ඝ කිරීමේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවට විරුද්ධ ව තමා නියෝජනය කළ දකුණු කොළඹ අසුනින් ඉල්ලා අස්වූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එම ආසනය නැවත තරග කොට විශිෂ්ට ජයග්‍රහණයක් අත්කර ගත්තේය.

මේ සියලුම කුඩු මහත් නවීකරණයන්හි සාමූහික ප්‍රතිඵලය වූයේ එක්සත් ජාතික පක්ෂය ජනප්‍රසාදයට පත්වීමේ ප්‍රවණතාවක් රට පුරා උද්ගත වීමයි.

# 1977 මහ මැතිවරණය



1977 මහ මැතිවරණය, පක්ෂ නායක ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ නායකත්වය උරගා බැලීමක් විය. නායකත්වය විසින් ක්‍රියාවේ යොදන ලද නවීකරණ ප්‍රතිපත්තියේ සාර්ථකත්වය විශිෂ්ට ලෙස ස්ඵුට කරමින් 1977 දී එක්සත් ජාතික පක්ෂය වාර්තාගත ජයග්‍රහණයක් ලැබීය. එහිදී එක්සත් ජාතික පක්ෂයට ලැබුණු ඡන්ද සංඛ්‍යාව තිස්එක් ලක්ෂ හැත්තෑ නවදහස් දෙසිය විසි එකකි. තේරී පත්වූ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී සංඛ්‍යාව 140කි. ඒ වතාවේ දී 1970 දී ලබාගත් ඡන්ද සංඛ්‍යාවට වඩා ඡන්ද 13 ලක්ෂයක් දිනා ගැනීමට පක්ෂයට හැකි විය. ලැබූ ඡන්ද ප්‍රතිශතය 50.92කි. මෙය මැතිවරණයක දී පාර්ලිමේන්තුවට එක් පක්ෂ යකින් තේරී පත්වුණු වැඩිම මන්ත්‍රී සංඛ්‍යාව විය. එක්සත් ජාතික පක්ෂයට පාර්ලිමේන්තුවේ හයෙන් පහක බලයක් ලැබුණු අතර එය ප්‍රජාතන්ත්‍රවාදී රටවල මැතිවරණ ඉතිහාසයේ සනිටුහන් වූ කැපී පෙනෙන ජයග්‍රහණයක් විය.




මෙය ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයෙහි කවර දේශපාලන පක්ෂයක් විසින් හෝ ලබන ලද විශිෂ්ටතම ජයග්‍රහණය වූයේය. ඒ ජයග්‍රහණය තවත් නවීකරණ රැසකට ප්‍රවේශය වූයේය.

1978 දී නව පාලන ව්‍යවස්ථාව සම්මත කරගත්හ. එම වර්ෂයේදීම ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා වශයෙන් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා පත්වූයේය. එතැන් පටන්, එක්සත් ජාතික පක්ෂය විසින් ජයග්‍රහණ රැසක් ලබාගන්නා ලදී.

1982 වර්ෂයේ දී පැවති ජනාධිපති තරගයේ දී ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා නැවතත් ජයග්‍රහණය කළේය.

එම ජනාධිපති තරගයේ දී එක්සත් ජාතික පක්ෂය විසින් ලබාගන්නා ලද ඡන්ද සංඛ්‍යාව තිස්හතර ලක්ෂ පනස්දහසකි.



# රණසිංහ ප්‍රේමදාස

1988 වර්ෂයේ පැවති ජනාධිපති තරගය සඳහා එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා තෝරා ගැනිණි. එතුමා එම වසරේ දී ජනාධිපති තරගයෙන් ජය අත්පත් කොට ගත්තේය.

ඉන්පසු ව්‍යවස්ථාවට අනුව ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා 1989 ජනවාරි මස 2 දා ජනාධිපති පදවියෙන් විශ්‍රාම ලැබූ අතර ශ්‍රී ලංකාවේ දෙවෙනි විධායක ජනාධිපති වශයෙන් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා දිවුරුම් දුන්නේය.

ජනාධිපති පදවියට පත්වෙමින්, එක්සත් ජාතික පක්ෂ නායක රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් ලබන ලද ඡන්ද සංඛ්‍යාව විසිපන්ලක්ෂ හැටනව දහසකි.

1989 දී පැවති මහමැතිවරණයෙන්, එක්සත් ජාතික පක්ෂය යළිත් ජයග්‍රහණය කළේය. එක්සත් ජාතික පක්ෂය විසින් ලබන ලද ඡන්ද සංඛ්‍යාව විසිඅටලක්ෂ තිස්හත් දහසකි. සාක් රාජ්‍ය නායක සමුළුවේ සභාපති ධූරයට පත් වූ ශ්‍රී ලංකාවේ පළමුවැනි රාජ්‍ය නායකයා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාය.



# ඩී.බී. විජේතුංග

1993 මැයි 1 දා එක්සත් ජාතික පක්ෂයේ පස්වන නායක රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ හදිසි අභාවයෙන් පසු ඩී. බී. විජේතුංග මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ හය වන නායකයා වශයෙන් පත් කෙරිණි. විජේතුංග රජයේ අගමැතිවරයා වශයෙන් සභානායක රනිල් වික්‍රමසිංහ මහතා පත් විය. විජේතුංග මැතිතුමාගේ නායකත්වයෙන් 1994 අගෝස්තු මහා මැතිවරණයට මුහුණ දුන් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත්වූයේය. මෙහිදී එක්සත් ජාතික පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව තිස්හතර ලක්ෂ නවසිය අසූවකි. තේරී පත්වූ එජාප මන්ත්‍රී සංඛ්‍යාව 86 කි.

යළිත් 1994 නොවැම්බර් මාසයේදී පැවති ජනාධිපති තරගයෙන් ද එක්සත් ජාතික පක්ෂය අන්ත පරාජයට පත් විය.

මේ ජනාධිපති තරගය සඳහා එක්සත් ජාතික පක්ෂය විසින් මුලින් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයා වූ ගාමිණී දිසානායක මැතිතුමා බෝම්බ ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්විය. පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා මෙසේ අභාවප්‍රාප්ත වීම නිසා එක්සත් ජාතික පක්ෂයට කඩිනමින් නව අපේක්ෂකයකු තෝරා ගැනීමට සිදු විය. ජනාධිපතිවරණයට සති දෙකක පමණ කාලයක් තිබියදී ජනාධිපති තරගය සඳහා ශ්‍රීමා දිසානායක මහත්මිය ආදේශ අපේක්ෂිකාව හැටියට ඉදිරිපත් කෙරිණි. රට තුළත්, පක්ෂය තුළත් මේ අවදියේ පැවති අර්බුදකාරී තත්ත්වය යටතේ එක්සත් ජාතික පක්ෂයට එම ජනාධිපතිවරණයේ දී ලබාගත හැකි වූයේ ඡන්ද විසිහත්ලක්ෂ එකසිය පනහක් පමණි.

# රනිල් වික්‍රමසිංහ



එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා පක්ෂයේ හත් වන නායකයා වශයෙන් පත්වූයේ 1994 නොවැම්බර් මාසයේදීය.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙරටට නිදහස ලැබීමෙන් පසුව උපන් පරපුරෙන් පක්ෂ නායකත්වයට පත්වූ පළමු වැන්නාය.

1994 දී පක්ෂ නායකත්වයට පත්වී සතියක් ගත වන්නටත් පෙර රනිල් වික්‍රමසිංහ මැතිතුමා පක්ෂ ප්‍රතිසංවිධාන ව්‍යාපාරය ආරම්භ කළේය.

ජන්ද විමසීම් තුනකින් පරාජයට පත්වීමෙන් ද, නායකයින් රැසක් අහිමි වීමෙන් ද එක්සත් ජාතික පක්ෂය මේ වන විට ඉතා දුර්වල තත්වයකට පත්වී තිබුණි. පක්ෂය භේද බින්න කොට එය කඩා බිඳ දැමීමට කැස කවන බලවේග ඒ වන විටත් ක්‍රියාත්මක වී තිබුණි. ඒ තත්වය මැනවින් වටහා ගත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා පක්ෂය ආරක්ෂා කර ගන්නා අතර එය යළි ගොඩ නැංවීමට නොපමාව පියවර ගත්තේය. යළි ශක්තිමත් කොට පක්ෂය ප්‍රබල ජනතා බලයක් බවට පත් කරන්නට රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ගත් පියවර බොහෝය. එක්සත් ජාතික පක්ෂයේ නව දේශපාලන දර්ශනය 21 වන සියවසේ නවීන සමාජයීය, ආර්ථික හා ලෝක ප්‍රවණතාවන්ට ගැලපෙන පරිදි "නව පරපුරකට නව මඟක්" යන තේමාව යටතේ සකස් කිරීමට එතුමා යුහුසුළු විය.



පක්ෂයේ යාන්ත්‍රණය තුළ දුර්මුඛ වී තිබූ තරුණ හා කාන්තා සංවිධාන නව මුහුණුවරකින් ශක්තිමත් කිරීමට පියවර ගැනිණි. ජාතික යොවුන් පෙරමුණ හා ලක් වනිතා පෙරමුණ ඒ අනුව කල එළි බහින ලදී. අඩ පණ වී තිබූ පක්ෂ සංවිධාන ජාලය තුළ බිම් මට්ටමේ සංවිධාන ඉහළට එසවීම සඳහා පර්ෂද මට්ටමින් සංවිධාන ජාලයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය විය. පක්ෂය සමග තිබූ බටහිර හා ආසියාතික සබඳතා යළි පන ගැන්වීමට ද කටයුතු කෙරිණ. නවීන ලෝකයට ගැලපෙන පරිදි දේශපාලන පුහුණුව ලබා ගැනීම සඳහා පක්ෂ නිලධරින් හට විදේශීය පුහුණුව ලබාදීමට ද විදේශීය දේශපාලන විශේෂඥයින් මෙරටට කැඳවා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රවර්ධනයට ඔවුන්ගේ දැනුම ලබා ගැනීමට ද පියවර ගැනිණ.



බලය ලබා ගැනීමට මෙන්ම බලය පවත්වා ගෙන යාමට ද විධිමත් දේශපාලන පුහුණුව හා මනා සංවිධානය අත්‍යාවශ්‍ය බව තරයේ විශ්වාස කළ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉවසීමෙන් යුතුව සිය පක්ෂ සේනා බල මුළු තර කිරීමට හා සංවිධානය කිරීමට ස්වකීය කාලය කැප කළේය. ඒ අතර තුර මෙතෙක් කිසිදු නායකයෙකු ගමන් නොකළ දුෂ්කර ගම්මාන වෙත පිවිසෙමින් එම ජනතාවගේ අදහස්වලට ඇහුම්කන්

දීමට ද පක්ෂයේ පණිවුඩය ඔවුන් වෙත සම්ප්‍රේෂණය කිරීමට ද ඉතිරි කාලය එතුමා වැය කළේය.

කාලයාගේ ඇවෑමෙන් 1999 ජනාධිපතිවරණය වන විට පක්ෂ සංවිධාන බලමුළු ගන්වා තිබූ අතර ස්වකීය දේශපාලන ප්‍රතිවාදියා පරාජය කිරීමට තරම් වූ ජනමත පෙරළියක් සිදු කිරීමට රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමත් වී තිබුණි. එහෙත් උතුරේ අන්තවාදී ව්‍යාපාරය මඟින් මැතිවරණ දිනය කට උඩ තිබිය දී අපේක්ෂකයා වෙත එල්ල කෙරුණු මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය නිසා මැතිවරණ ව්‍යාපාරය කනපිට පෙරළීය. එක්සත් ජාතික පක්ෂයට පරාජය අත්විය. එම උණුසුම පිටම පවත්වන ලද 2000 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ද එක්සත් ජාතික පක්ෂයට පරාජය හිමිවීම නොවැලැක්විය හැකි විය.

එහෙත් ඒ වන විට රටේ දේශපාලන, ආර්ථික හා සමාජීය වටපිටාව මහත් පරිහානියකට ගොදුරු වී තිබුණි. සියලුම ආර්ථික මර්මස්ථාන වෙත කොටි සංවිධානය ප්‍රහාර එල්ල කළ අතර ආර්ථිකය කඩා වැටී ජන ජීවිතය අඩාල වී උතුරේ පමණක් නොව දකුණේ ද ජීවිතය පිළිබඳ සැක සංකා ද අනාගතය පිළිබඳ අවිශ්වාසය ද පැතිරී ගියේය.





වැඩි දිනක් නොගොස් පවතින රජය කෙරෙහි කළකිරී සිටි පාර්ලිමේන්තු මැති ඇමැතිවරුන් දිනා ගැනීමෙන් විරුද්ධ පක්ෂයට පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා ගැනීමට රනිල් වික්‍රමසිංහ මැතිතුමා උපායශීලී වූ අතර එකෙනෙහිම පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. එහි ප්‍රතිඵලය වූයේ එළැඹි මහා මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පෙරමුණ විශිෂ්ට ජයග්‍රහණයක් ලැබීමයි.

පිට පිට මහා මැතිවරණ දෙකකින් පරාජයට පත් වුවද එකෙනෙහිම පැවැති මහ මැතිවරණයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලැබීම වූ කලී දීර්ඝ කාලයක් පක්ෂය ශක්තිමත් කිරීමට කාලය කැපකර ශක්තිමත් යාන්ත්‍රණයක් සහිතව කල් යල් බලා සටනට එළඹීමේ සූක්ෂම දේශපාලන නායකත්වයක් හා දූරදර්ශී දේශපාලන දැක්මක් සහිත එක්සත් ජාතික පක්ෂයේ වික්‍රමසිංහ නායකත්වයේ ප්‍රතිඵලයයි.

ඒ අනුව රනිල් වික්‍රමසිංහ මැතිතුමා දෙවන වතාවටත් අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත් විය. එහෙත් මෙම ආණ්ඩුව ව කලී මෙතෙක් ලංකා ඉතිහාසයේ නොතිබූ අන්දමේ අත්දැකීමක්ය. පූර්ණ බල ඇති විධායකය ප්‍රතිවාදියා සතු වූ අතර ව්‍යවස්ථාදායක බලය එක්සත් ජාතික පක්ෂය සතු විය. මෙම අලුත් අත්හදා ලැබීම තුළ ඕනෑම මොහොතක පවතින ආණ්ඩුව ව්‍යාකූල කිරීමට ප්‍රතිවාදියට ශක්තිය ඇති බව දැන දැනම රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ සම්ප්‍රදායික අභිලාෂය වූ එක්සත් රටක් හා අතමිට සරු හෙටක් වෙනුවෙන් එඩිතර සහ නිර්දෝෂී පියවර රාශියක් ගත්තේය. එවකට හමුදා ශක්තිය අතින් ප්‍රබල ස්ථානයක සිටි කොටි සංවිධානය සමඟ සාම ගිවිසුම අත්සන් කිරීමත්, දිගු කාලීන සාමය සඳහා සාකච්ඡාවලට ප්‍රවේශ වීමත් මඟින්








කොටි සංවිධානය නිසල කිරීමත් ජාත්‍යන්තර සහයෝගය දිනා ගැනීමත් රටේ ආර්ථිකය යළි පණ ගැන්වීමත් යන ත්‍රිත්ව ක්‍රියාවලිය එවකර ක්‍රියාත්මක කිරීමේ සූක්ෂම අභිලාෂය මේ තුල ගැබ්ව තිබුණි.

මෙම ක්‍රියාව ලෝක නායකයින්ගේ බොහෝ ප්‍රසාදයට හා අමන්දානන්දයට ද හේතු වූ අතර ජාත්‍යන්තර ටයිම්ස් සඟරාව ද මෙය අතිමහත් එඩිතර ක්‍රියාවක් වශයෙන් හඳුන්වා දීමට නොමසුරු විය. බලාපොරොත්තු වූ ලෙසටම සාම සාකච්ඡා ඉදිරියට ගිය අතර ජාත්‍යන්තර සහයෝගය ලැබී ආර්ථිකය වේගයෙන් වර්ධනය විය. සෘණ මට්ටමේ තිබුණු ආර්ථිකය ධන අගයක් දක්වා ගෙන ඒමට කෙටි කාලයක් තුළ හැකිවීම එක්සත් ජාතික පක්ෂයේ විශිෂ්ට නායකත්වයේ ඵලයකි.

වසා දැමුණු මංමාවත් විවෘත කෙරිණ. උතුරු නැගෙනහිර දකුණ යා විය. උතුරු දකුණු පුරවැසියෝ දිවයිනේ සතර දික් භාගයේ සංචාරය කළහ. නෑ ගමන් ගියහ. බංකර්, බැරියර් ඉවත් විය. ඉදිරි අනාගතය සඳහා යුහුසුළුව සැලසුම් සම්පාදනය කිරීම, අධිවේගී මාර්ග, ජාත්‍යන්තර ගුවන් තොටුපලවල්, වරාය, විදුලි දුම්රිය ඇතුළත් මහා යටිතල පහසුකම් පිළිබඳ සැලසුම් ඇතුළත් "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩ සටහන ආරම්භ විය. මේවා පණ ගැන්වීමට ජාත්‍යන්තර සහයෝගයේ දෑත් ලංකාවට දිගු කළේය. ශ්‍රී ලංකාවට ආධාර දෙන විශේෂ තෝකියෝ සමුළුව මඟින් රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පෙරමුණු රජයට ඩොලර් කෝටි 45,000 ක ආධාරයක් පිරිනමන ලදී. එය වූ කලී එතෙක් මෙතෙක් එකවර ලංකාවට ලැබුණු විශාලතම ආධාර මුදලයි.

අවාසනාවකට බලාපොරොත්තු වූ පරිදිම කල් යල් බලා ප්‍රතිවාදී විධායකය මඟින් අමාත්‍යාංශ අත්පත් කර ගැනීමෙන් අනතුරුව අන්තවාදී පක්ෂ හා සංවිධාන මඟින් උඩගෙඩි දෙනු ලදුව ජාතිවාදී ගිනි දැල් අවුළුවා පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. එහි ප්‍රතිඵලය වශයෙන් 2004 මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් විය. එක්සත් ජාතික පක්ෂය මඟින් සකස් කරන යෝධ සැලසුම් මෙන්ම අති විශාල ආධාර මුදල ද වතුරේ ගියේය. යළිත් වතාවක් රට ආපස්සට හැරුණි.

දේශපාලන හුටපටයක් නිසා 2005 ජනාධිපතිවරණය කල් ඇතුව කරලියට එන්නේ මෙකලයි. ඒ සඳහා පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් වන අතර එක්සත් ජාතික පක්ෂ සංවිධානය අතින් ද, ස්වකීය ඉලක්කය සපුරා ගැනීමට ගොනු කරගත් ශක්තිය අතින් ද මනා ලෙස සන්නද්ධ වී සිටි රනිල් වික්‍රමසිංහ

මැතිතුමා පරාජයට පත් කිරීම අසීරු බව දැන සිටි ප්‍රතිවාදී අපේක්ෂකයා අන්ද මන්ද වී සිටියේය.

රනිල් වික්‍රමසිංහ යනු දේශපාලන කුටෝපායෙහි අගතැන්පත් අයෙකු ලෙස අත්දැකීමෙන්ම වටහා ගෙන සිටි කොටි සංවිධානය ඔහුගේ ජයග්‍රහණය වූ කලී තමන්ගේ දේශපාලන පරාජය බව තක්සේරු කොට අවසන් මොහොතේ ජනාධිපතිවරණය ඔන්න මෙන්න තියා උතුරු නැගෙනහිර දෙමළ ජනතාවට ඡන්දය දීමෙන් වළකින ලෙස නියෝග දුන්නේය.

එහි ප්‍රතිඵලය වූයේ තමන්ට දිගු කාලීන සාමය උදාකර දෙන බව අත්දැකීමෙන් දන්නා එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයාට ඡන්දය දීමට දෙමළ ජනතාවට බැරි වීමය. සියලුම වාසි තිබිය දී ඒ අනුව රනිල් වික්‍රමසිංහ මැතිතුමා සොච්චම් ගණනකින් 2005 ජනාධිපතිවරණය පරාජයට පත් විය.

ඉනික්බිතිව පක්ෂයේ බැරෑරුම්ම අවධිය උද්ගත වූ බව නොරහසකි. පක්ෂය භේද භින්න කොට විනාශ කිරීමට හෝ දියාරු කිරීමට කුමන්ත්‍රණ ක්‍රියාත්මක විය. අනෙක් අතින් සාම වැඩ පිළිවෙළ අකර්මන්‍ය වූ අතර ඒ වෙනුවට රටට ද, ජනතාවට ද වඩා හානිකර යුද්ධමය මාර්ග තෝරා ගැනිණ. සාමය සඳහා වූ ක්‍රියාවලියට බාධා නොකරන බවට එකල රජයේ එක්සත් ජනතා නිදහස් සන්ධානය සමග එක්සත් ජාතික පක්ෂය ගිවිසුමක් පවා අත්සන් කළ නමුදු ඒ ගැන නොතකා එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විවිධ වරදාන පෙන්වා රජයට එක්කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක විය.

පක්ෂයේ ඉහළ මට්ටමේ සිට බිම් මට්ටම දක්වා ජනතා නියෝජිතයින්, සාමාජිකයින් විවිධ හේතු මත පක්ෂයේ අනුදැනුමක් නැතිව රජය සමග එක් විය. පක්ෂය සෝදා පාළුවට ලක් වෙමින් තිබුණි.

ඒ අනුව එම බැරෑරුම් අවස්ථාවේ තම ව්‍යායාමය විය යුත්තේ පක්ෂය රැක ගැනීම බව මැනවින් වටහා ගෙන සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ වෙනුවෙන් නොසැලී ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් හැටියට අද දවසේ ජයග්‍රාහී දේශපාලන පක්ෂයක් වශයෙන් 70 වෙනි සංවත්සරය සැමරීමට හැකිවූ බව එතුමාට මෙන්ම පක්ෂය රැක ගැනීම උදෙසා දිවිහිමියෙන් ක්‍රියාකළ ක්‍රියාධරයන්ට ද ගෞරවයක් වශයෙන් එක් වරක් හෝ මේ වාර්තාවේ සටහන් කර තැබීම මාගේ යුතුකමක් වශයෙන් කල්පනා කරමි.

අනතුරු එළඹි කාල පරිච්ඡේදය උතුරේද, දකුණේද බිහිසුණු සහ තැති ගන්වන සුළු කාල පරිච්ඡේදය බවට නොකිවමනාය. එම කාලය තුළ යුද්ධයේ මුවාවෙන් ඊටද, රජයටද, දූෂණය හා භීෂණයටද එරෙහි වන්නන්, මාධ්‍යවේදීන්, වෙනස් මත දැරූවන්, උගතුන්, සිවිල් සංවිධාන නියෝජිතයින්, ශිෂ්‍යයින් පැකිලීමකින් තොරව අතුරුදන් කළ බවද නොරහසකි. එහි ප්‍රතිඵලයක් හැටියට ලංකාව ලොව හුදකලා වූ රාජ්‍යයක් බවට පත්විය. කෙළවර බොහෝ ධන හා ජීවිත සංහාරයකින් පසු තෝරා ගත් යුද මාවතේ අග්‍රස්ථානය කරා පැමිණීමට එවකට රජයට හැකි වූ අතර එහි මහගු ඵල නෙලා ගැනීමට 2009 ජනාධිපතිවරණය කැඳවන ලදී. එම අවස්ථාවේදී රටේ ප්‍රබලම තනි දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය තම අපේක්ෂකත්වය කැප කරමින් අනෙකුත් දේශපාලන පක්ෂ හා සංවිධාන සමග ඒකාබද්ධව පොදු අපේක්ෂක වශයෙන් හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතා ඉදිරිපත් කරන ලදී. එම තරගයේ ජයග්‍රහණය

කිරීමට පොදු අපේක්ෂකයාට අවකාශයක් නොලැබිණි. ඉන් අනතුරුව එළඹි පාර්ලිමේන්තු මැතිවරණයේ ද ස්වාභාවිකවම ජනාධිපති ධූරය හිමි දේශපාලන සංවිධානය ජයග්‍රහණය කළේය.

2010 න් පසු එළඹෙන්නේ මෙරට දේශපාලන ඉතිහාසයේ අඳුරුතම කාල පරිච්ඡේදය බව කිවමනාය. තනි පුද්ගලයෙක් අත බලය කේන්ද්‍ර කර ගැනීම සඳහා ව්‍යවස්ථාව වෙනස් කර ගන්නා අතරම අගවිනිසුරු පහ කර අධිකරණයේ බලයද තමා වෙත නතු කර ගෙන පවුල්වාදය පෝෂණය කොට ජාතික ධන සම්පතේ බහුතරය ඥාතීන්ට සහ හිතවතුන්ට බෙදා හදා දෙන අතලොස්සක් සැප විඳින බහුතරය දුක් විඳින රාජ්‍යයක් ඇති කොට තිබුණි. එහි ප්‍රතිඵලය වූයේ ඒවාට එරෙහි වන්නන්ද රාජ්‍ය අනුග්‍රාහය ඇතිව අතුරුදහන් කිරීම හෝ බිය ගැන්වීමයි.

අනෙක් අතින් එක්සත් ජාතික පක්ෂයේ කැරලි ගණනාවකට නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මුහුණ දෙන්නට සිදු විය. එක අතකින් රට අගාධයට යද්දී අනෙක් අතින් එය රටට නායකත්වය දිය හැකි දේශපාලන නෞකාවද මහා කුණාටුවකට හසුවී තිබුණි. එම නෞකාවේ නියමුවා වූ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා රටේ ඉදිරි ගමනට එක්සත් ජාතික පක්ෂය අත්‍යවශ්‍ය බව වටහා ගෙන එම පක්ෂය ආරක්ෂා කර ගැනීමට පියවර ගත්තේය.




2013 පක්ෂ සම්මේලනයේදී රනිල් වික්‍රමසිංහ මහතා පාක්ෂිකයන්ගෙන් ඉල්ලා සිටියේ තව වසර දෙකක් තුළ පැවැත්වෙන මැතිවරණය සඳහා සූදානම් වීම අරඹන ලෙසයි. දේශපාලනය පිළිබඳ දූරදර්ශී කියැවීමක් ඇති නායකතුමන් එසේ ඉල්ලා සිටිය ද, සමහරු මේ ප්‍රකාශය පිළිබඳ බැලූයේ සැකමුසු ආකල්පයකිනි.

නමුත්, දිනෙන් දින කඩා වැටෙන ආර්ථිකය නිසා මැතිවරණයක් කරා ආණ්ඩුව තල්ලු වෙමින් පවතින බව අවබෝධ කර ගෙන සිටි වික්‍රමසිංහ මහතා, ඒකාධිපති සහ පවුල්වාදී ආණ්ඩුවට එරෙහි ලොකු කුඩා සියලු සංවිධාන ද, දේශපාලන පක්ෂ ද ඒකරාශී කර ගැනීමේ කාර්යයෙහි යුහුසුළු විය. ඒ සඳහා අවශ්‍ය කරන මූලෝපායික මාර්ගෝපදේශකත්වය හා දැනුම ද ජාත්‍යන්තරයෙන් ලබා ගැනීමට කටයුතු කළේය. පක්ෂ සංවිධාන ශක්තිමත්ව සන්නද්ධ කළේය.

2014 ඌව පළාත් සභා මැතිවරණය මේ සංවිධාන ශක්තිය උරගා බැලීමට කදිම අවස්ථාවක් විය. එහිදී දැල්වුන කොළ එළිය ඔස්සේ මහජනයා දුන් පණිවිඩය වූයේ සියළු බලවේග ඒකරාශී කර ගැනීමෙන්, ඒකාධිපති පවුල් පාලනය බිඳ දැමීමට එක්සත් ජාතික පක්ෂයට හැකියාව හා අවස්ථාව එළඹී ඇති බවයි. දවසින් දවස ප්‍රපාතයට යන ආර්ථිකය හමුවේ සිය බලය සදාකාලිකව රැක ගැනීමට කල් ඇතුව කැඳවන ලද 2015 ජනාධිපතිවරණය ඉදිරියේදීද එක්සත් ජාතික පක්ෂය ක්‍රියා කළේ සිය නව දේශපාලන දර්ශනය වූ නව "නව පරපුරකට නව මඟක්" යන තේමාවට සහමුලින්ම සරිලන ආකාරයෙනි. එක්සත් රාජ්‍යයක් ගොඩනැගීම සඳහා සම්මුතිවාදී චින්තනයෙන් කටයුතු කළ යුතු බව වටහා ගත් නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ධන බලය, මැර බලය හා අයුතු රාජ්‍ය බලය

හිනි පෙත්තටම යොදාගෙන මියෙම්වා, රැකෙම්වා කියා සටනට එන ඒකාධිපති පාලකයෙකු පරාජය කිරීමට ඔවුන්ගේ සංවිධානය නැමැති ජලය රැස් කළ ජලාශයෙහි වැව් බැම්ම පුපුරුවා හැර ශූන්‍ය කළ යුතු බව දැන සිටියේය.

ඒ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයාට අපේක්ෂකත්වය පිරිනමන ලද අතර නායකත්ව මට්ටමේ සිට බිම් මට්ටම දක්වා ක්‍රියාධරයින් විරුද්ධ පක්ෂය සමග එක් විය. ජාතිවාදී, පවුල්වාදී ඒකාධිපති පාලනයට එරෙහිව ජාති, ආගම්, පක්ෂ භේදයකින් තොරව ජනතාව ඒකරාශී වීමේ ප්‍රතිඵලය හැටියට එක්සත් ජාතික පක්ෂයේ පුරෝගාමීත්වය ඇතිව ජනාධිපතිවරණය ජයග්‍රහණය කිරීමට හැකි විය. රනිල් වික්‍රමසිංහ මැතිතුමා තුන්වෙනි වතාවටත් එක්සත් ජාතික පක්ෂයේ අගමැතිවරයා වශයෙන් පත්විය.



ජනාධිපතිවරණයේදී පොරොන්දු වූ පරිදි දින 100 ක් ඇතුළත ඒකාධිපති පවුල් වාදය මගින් තලා පෙලා දමන ලද ජනතාවට සහන සැලසීමටත්, ඒකාධිපතිවාදයේ අඩු කඩා දැමීමටත් පොරොන්දු වූ යහපාලනය ස්ථාපිත කිරීම සඳහා මූලික පියවර තැබීමටත් හැකි විය.

දින 100 යේ ක්‍රියාකාරකම් ගැන පැහැදුණු මහජනතාව 2016 පාර්ලිමේන්තු මැතිවරණයේදීද එක්සත් ජාතික පක්ෂයට වැඩිම ආසන සංඛ්‍යාවක් හිමිකර දුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා හතර වෙනි වතාවටත් ශ්‍රී ලංකා රජයේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත්විය. එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් යුතුව නව රජයක් පිහිටුවන ලදී. අපගේ ආණ්ඩුව ජාතික ආණ්ඩුවකි. අප ජයග්‍රහණය කළහොත් ජාතික ආණ්ඩුවක් පිහිටුවන බවට වුණ පොරොන්දුව අප ඉෂ්ට කර තිබේ. රටේ දූදරුවන්ගේ අනාගතය උදෙසා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කර ගැනීමට මානව හිමිකම් සපිරුණු නිදහස සපිරි එක් සේසත්, ඒකී යුද්ධයෙන් තොර රටක් සඳහා නව ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීමට ජාතික ආණ්ඩුවක් පිහිටුවා ගත යුතුව තිබුණි. එමෙන්ම යළි කිසිදා වර්ග වාදයට හිස එස නොවීමට, යළි කිසිදාක රට ආපස්සට නොයාමට, ජාතික ආණ්ඩුවක් ස්ථාපිත කළ යුතුව තිබිණ.

නිදහසේ සිට මේ දක්වා සියලුම නවීන දේශපාලන අදහස් එක්සත් ජාතික පක්ෂය මගින් ඉදිරිපත්කර සාක්ෂාත් කර ගත්තා සේම මෙවරද නවීන දේශපාලන දැක්මක් හා සම්මුතිවාදී මාවතක් අපි තෝරාගෙන ඇත්තෙමු. එම මාවත ඔස්සේ ආර්ථිකය දියුණු කොට, අධ්‍යාපනය ඉහළ නංවා, දූෂණය මුලින් උපුටා දමා, යටිතල පහසුකම් සපුරා නිදහස තහවුරු වූ අලුත් රටක් තව මාස 47 කින් සපුරා ගැනීම අපේ හමුවේ ඇති ඉලක්කයයි. එය 70 වසරක ඉතිහාසයක් ඇති අපගේ ඉපැරණි දේශපාලන අත්දැකීම්ද, පරිණතභාවයද සමග නවීන අදහස් ද එකතු කොට ගෙන සපුරා ගත හැකි බව අපගේ විශ්වාසයයි.

එක්සත් ජාතික පක්ෂය පැරණි වුවද එය එක තැන පල් නොවන, දිනෙන් දින අලුත් වන එබැවින් නොමියෙන පක්ෂයකි. එය එදාට මෙන්ම අදටත් වලංගු සත්‍යයකි. එබැවින් එක්සත් ජාතික පක්ෂයේ 70 වසරක ඉතිහාසය යනු නවීනත්වය මිස අන් කිසිවක් නොවේ. එක්සත් ජාතික පක්ෂයේ අනාගතය රඳා පවතින්නේ ද නවීනත්වය මතය.

# අපේ විප්ලවය



දේශපාලන අත්දැකීම් හා පළපුරුද්ද අතින් එක්සත් ජාතික පක්ෂය සතු සුවිශේෂ කළමනාකරණ හැකියාවන් ඉකුත් අඩ සියවස තුළ දී අපගේ ජනතාවගේ ජීවිත සුඛිත මුදිත කිරීම සඳහා යොදා ගන්නා ලදී.

රට පාලනය කිරීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය දක්ෂතාවන් හා දුර දක්නා නුවණ සතු පක්ෂයක් ලෙස එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිරූපය ගොඩනැගුණේ වසර 31ක් රට පාලනය කිරීමෙන් හා වසර 19ක් විරුද්ධ පක්ෂයේ සිටීමෙන් වගා කරගත් දක්ෂතා සම්මිශ්‍රණය කිරීමෙනි.

වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම එක්සත් ජාතික පක්ෂය විප්ලවීය ජයග්‍රහණයන් ජාතියට අත්කර දුන් පක්ෂයකි.

# විදේශ ආධිපත්‍යයෙන් නිදහස

නිදහස දිනාගැනීමෙන් එක්සත් ජාතික පක්ෂය අප දේශපාලන වහල් භාවයෙන් මුදා ගත්තේ ය.

විදේශයන්ට යටවී සිටීමේ සම්ප්‍රදායෙන් හා චින්තනයෙන් මිදී, විදේශයන් සමග එක පෙළට සිට ගනිමින්, අදීන හා නොබැඳි පිළිවෙතින් සන්නද්ධවීමේ පසුබිම මෙරටට උදා කර දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි.



බැන්ඩුන් සම්මේලනය හරහා නොබැඳි ජාතීන්ගේ සම්මේලනය දක්වා ද, පොදු රාජ්‍ය මණ්ඩලයීය සාමාජිකත්වයේ සිට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දක්වා ද පියවර තබන්නට පසුබිම සහ අවකාශ උදා කර දුන්නේ ද එක්සත් ජාතික පක්ෂයයි. ජාතියේ ප්‍රතිමූර්තිය වර්ධනය වෙත්ම කලාපීය රටවල් සමග එකමුතු වී 'සාක්' සංවිධානය පිහිටුවීමට උද්යෝගීමත් ලෙස දායක විය. රටේ වාණිජ හා වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අපි ලෝක වෙළඳ සංවිධානයට ඇතුළත් වීමු.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස ලෝක අවධානය දිනා ගත් අප, ජනතාවගේ පරමාධිපත්‍යය සුරකිමින්, නිදහස් සමාජයක් ගොඩනැගීමෙන්

දේශපාලන නිදහස අර්ථවත් කළෙමු. මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම නීතියෙන් දඬුවම් දිය හැකි වරදක් කරමින් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුක්‍රම පනතට නීති රීති ඇතුළත් කළේය.

පාර්ලිමේන්තුවේ අනුමැතියක් නැතිව හදිසි නීතිය දීර්ඝ කිරීමට නොහැකි අන්දමට විධායක බලතල සීමා කෙරිණි. පළාත් සභාවලට බලය පැවරීමෙන් රාජ්‍ය පාලනය විමධ්‍යගත කර ජනතාවට වඩාත් සමීප කළේ ද එක්සත් ජාතික පක්ෂයයි.

සිංහල හා දෙමළ රාජ්‍ය භාෂා කරන ලදී.

සංස්කෘතික පුනරුදයකට මං සලසමින් රාජ්‍ය අනුග්‍රහය සහිත කලා මණ්ඩලයක් පිහිටුවා දේශාභිමානයෙන් ජනතාව පෝෂණය කළේ ද එක්සත් ජාතික පක්ෂයයි. යුනෙස්කෝ සංවිධානයේ සහයෝගය ඇති ව ඇරඹුණු සංස්කෘතික ත්‍රිකෝණ වැඩපිළිවෙල රටේ පෞරාණික ශ්‍රී විභූතියත් ජාතික උරුමයත් සුරැකීමට මහෝපකාරී විය.

ශ්‍රී ලංකාවේ ඉපැරණි රාජධානියක් වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රටේ අගනුවර බවට පත් කර මුළු මහත් ප්‍රදේශයම සංවර්ධනය කිරීමට සාර්ථක පියවරක් තැබීය.





අනුරාධපුර නව නගරය, අම්පාර, ගිරාදුරුකෝට්ටේ, ගල්නෑව, බුල්නෑව, ඇඹිලිපිටිය, රත්නපුර සහ තෙල්දෙණිය යනාදී ප්‍රදේශවල නවීන පහසුකම්වලින් යුතු නව පුරයන් බිහි කළේ ද එක්සත් ජාතික පක්ෂයයි.


ආගම, ජනතාවගේ අධ්‍යාත්මික ගුණවගාව පෝෂණය කිරීමට අත්‍යවශ්‍ය බව හැමදාමත් එක්සත් ජාතික පක්ෂයේ විශ්වාසය වූයේය. ඒ අනුව ආගමික සංස්ථාවන් දියුණු කිරීමටත් ඒවා වඩාත් ගෞරවනීය වුත් පූජනීය වූත් තත්ත්වයකට ගෙන ඒම සඳහා එක්සත් ජාතික පක්ෂය අනුග්‍රහය දැක්වීය.

දේශපාලන බලාධිකාරයේ සහ කඩාකප්පල්කාරී චීවරධාරීන් පිරිසකගේ බලපෑමෙන් මල්වතු පාර්ශවය දෙකඩ කිරීමට උත්සාහ දැරූ අවස්ථාවක, ඒ සඳහා සෘජුව ම මැදිහත් වීමට ද, ඒ උත්සාහය ව්‍යවර්ථ කිරීමට ද අපි කටයුතු කළෙමු.

## අවිද්‍යාවෙන් නිදහස

නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමත් සමග, සමාජයේ බලවතුන්ට පමණක් සීමා වී තිබුණු අවස්ථා හා වරප්‍රසාද ගමේ ගොඩේ දුගී දුප්පත් තරුණ තරුණියන්ටත් ලබා ගැනීමට හැකි විය. මේ අනුව රාජ්‍ය පරිපාලනය,

ඉංජිනේරු ශිල්පය, වෛද්‍ය වෘත්තිය, නීති වෘත්තිය, ගණකාධිකරණය හා මූල්‍ය කළමනාකරණය යන අංශවල උසස් තනතුරු ලබා ගැනීමේ වරම දුප්පත් දරු දැරියනට ද හිමි විය.



එක්සත් ජාතික පක්ෂයේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය නිසා තම දරුවන්ට නියම අධ්‍යාපනයක් ලබා දීමට අවශ්‍ය මුදල් නොමැතිකමින් පීඩාවට පත් දෙමාපියන් එම බරින් නිදහස් විය. පාසල් දරු දැරියනට නොමිලේ පොත්පත් සහ නිල ඇඳුම් සපයන ලදී. දිවයින පුරා මධ්‍ය මහා විද්‍යාල ඇති කර සෑම දෙනාටම එක හා සමානව විශ්ව විද්‍යාලය දක්වා උසස් අධ්‍යාපනය ලැබීමේ වරම ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. 1993 දී මේ රටේ දරු දැරියන් දස ලක්ෂ 4.3ක් (ලක්ෂ 43ක්) පාසල් අධ්‍යාපනය ලද අතර දහස් සංඛ්‍යාත පිරිසක් උසස් අධ්‍යාපන වරම ලදහ.

විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගතියට ද එක්සත් ජාතික පක්ෂය ක්‍රම සම්පාදනය කර ඒවා ඉතා සාර්ථකව ක්‍රියාත්මක කළේය. විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන හා කාර්මික අධ්‍යාපන ආයතනය, වෘත්තීය අධ්‍යාපන ආයතනය සහ අධ්‍යාපන පර්ෂද පිහිටුවීමෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියකට පදනම දැමූ අතර පශ්චාත් උපාධි පහසුකම් ද සලසන ලදී. 1993 දී විශ්ව විද්‍යාලවල උගත් උපාධි අපේක්ෂක සංඛ්‍යාව 32,000ක් විය.




මාධ්‍ය නිදහස එක්සත් ජාතික පක්ෂය යටතේ සුරක්ෂිත විය. රූපවාහිනී සේවා ආරම්භ කිරීමෙන් ශ්‍රී ලංකාව විශ්ව සන්නිවේදන ජාලයට සම්බන්ධ කළ එක්සත් ජාතික පක්ෂය, පුද්ගලික ගුවන්විදුලි හා රූපවාහිනී සේවාවන් පවත්වාගෙන යෑමට ඉඩ සැලැස්වීම නිසා විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය ජනතාවගේ දැනුම වැඩුමට දායක වෙමින් ජාත්‍යන්තර තත්වයට දියුණු විය. ශ්‍රී ලංකාවේ දැනට පරිහරණය වන රූපවාහිනී සංඛ්‍යාව මිලියන 5ක් පමණ වන අතර ඊටත් වැඩි ගුවන් විදුලි යන්ත්‍ර සංඛ්‍යාවක් ක්‍රියාත්මක න්නේ ජංගම දුරකථන සහ වාහන වල ද ගුවන් විදුලිය ශ්‍රවණය කිරීමේ පහසුකම් ඇති බැවිනි. ඈත එපිට ගම් දනව්වල දුගී දුප්පත් ජනතාවට ලෝකයේ වෙනත් රටවල සිදුවීම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීමටත් ඔවුන්ගේ බුද්ධියේ නිම්වළලු පුළුල් කර ගැනීමටත් මේ මාධ්‍ය විප්ලවය දායක විය.

සන්නිවේදන අංශයේ ප්‍රගතිය ද එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණයකි. ජංගම සෙලියුලර් දුරකතන සේවාවන් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාවේ දුරකතන ජාලය ව්‍යාප්ත කළ එක්සත් ජාතික පක්ෂය, සාම්ප්‍රදායානුකූල දුරකතන සේවාවන් නවීකරණය කර අලුත් දායකයන් ලක්ෂ සංඛ්‍යාවකට පහසුකම් සැපැයීය.

අද නවීන සුහුරු දුරකථන ඔස්සේ මුළු ලොව ම තම අත්ලට ගෙන එන්නට හැකියාව ලැබී ඇත. මේ මහා විප්ලවයට මග පෑදූ පරිගණක දැනුම හා තාක්‍ෂණය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ ද, අන්තර්ජාල සබඳතා සඳහා ශ්‍රී ලංකාව එක් කළේ ද, එක්සත් ජාතික පක්ෂය යි.

# අගහිඟකමින් නිදහස



ජනතාවගේ කුසගින්න නිව්වේ ද එක්සත් ජාතික පක්ෂයයි. ගල්ඔය, උඩවලවේ සහ යෝධ මහවැලි ව්‍යාපාරය වැනි දැවැන්ත ඉඩම්, වාරිමාර්ග සහ ජල විදුලිබල යෝජනා ක්‍රම ආරම්භ කිරීමෙන් අති විශාල කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනයකට මුල පිරුවේ ද එක්සත් ජාතික පක්ෂයයි. කන්තලේ, පදවිය, හුරුළුවැව, කන්දලම වැව, කවුඩුල්ල, ගිරිතලේ සහ පරාක්‍රම සමුද්‍රය යන මහ වැව් සහ කුඩා වැව් දහස් ගණනින් ප්‍රතිසංස්කරණය කිරීමත් සමග රටේ වී නිෂ්පාදනය වසරක් වසරක් පාසා ඉහල ගියේය.



මහවැලි සංවර්ධන ව්‍යාපාරය කඩිනම් කර වසර 6 කින් නිමාවට පත් කිරීමට එක්සත් ජාතික පක්ෂය සමත්විය. මේ සුළු කාලය තුළ දී යෝධ වේලි 7 ක් ඉදි කර මහා ජලාශ 4 ක් ඉදි කරන ලදී. නිසරු වියලි බිම් අක්කර දහස් ගණන් මහවැලි දියවරින් පෝෂණය කර සරුසාර ගොවිබිම් බවට පත් කෙරිණි. මෙම නව ගොවිබිම්වල පදිංචි වූ ගැමි ගොවි පවුල් දහස් ගණනකගේ ජීවිත නව ජීවනාලෝකයකින් ප්‍රබෝධමත් විය.

ඉඩම් නැති ලක්ෂ 20කට පමණ ඉඩම් බෙදාදීම නිසා එම පවුල්වල ආර්ථිකය සුරක්ෂිත කර ගැනීමට මං සැලසුණි. දිවයිනේ වී නිෂ්පාදනය 1993 වන විට හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1430 දක්වා ඉහළ ගියේය. 2003 වසර වන විට අපි සහලින් ස්වයංපෝෂිත වුණෙමු. පෙර රජ දවසින් පසු ප්‍රථම වරට අපගේ ජනතාවට අවශ්‍ය සහල් අප රටේම නිපදවීමට අපි සමත් වීමු.

ජනතාවට නිවාස සැපයීම එක්සත් ජාතික පක්ෂය එඩිතරව හා සාර්ථකව මුහුණ දුන් තවත් අභියෝගයකි. තමන්ගේ හිසට තමන්ගේම සෙවණක් තනා ගැනීමට දුගී දුප්පතුන් හා අසරණයින් මැවූ සිහින සැබෑ කරමින් එක්සත් ජාතික පක්ෂය සම්පාදනය කළ නිවාස දස ලක්ෂයේ වැඩපිළිවෙල යටතේ දිවයිනේ නාගරික පෙදෙස්වල පමණක් නොව ඈත එපිට ගම් දනව්වල ද නව නිවාස ඉදි විය. නවීන සැලසුම්ක්‍රම ප්‍රායෝගික ඥාණය සහ නූතන ඉදිකිරීම් ශිල්ප ප්‍රයෝජනයට ගෙන දියත් කෙරුණු මේ දැවැන්ත සංවර්ධන ප්‍රයත්නය නිසා නව ගම්මාන, නගර හා උප නගර සිය දහස් ගණනක් බිහි විය.

කොටස් වෙළඳපොළේ පාදක පුළුල් කර කොටස් (යුනිට්) භාරකාර ආයතන ඇතිකර පොඩි මිනිහාටත් ලොකු ලොකු සමාගම්වල හා බැංකුවල පවා කොටස්කරුවන් වීමට වාසනාව උදාකර දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. මේ සමග ම පොදු ජනතාවට අතිරේක ආදායම් මාර්ගයක් පෑදුණු අතර ඔවුන්ගේ ඉතිරි කිරීම ද ඉහළ ගියේය. කුඩා වෙළෙඳ ව්‍යාපාර අංශය පෙර නොවූ විරූ අන්දමට ව්‍යාප්ත විය. මධ්‍යම පන්තිකයින්ගේ ආර්ථික තත්ත්වය ඉහළ ගිය අතර දුගී දුප්පත් තත්ත්වයෙන් මිදී මධ්‍යම පන්තියේ සැප සම්පත් භුක්ති විඳින සංඛ්‍යාව වේගයෙන් වර්ධනය විය.

කොටස් වෙළෙඳපොළ විවෘත ආර්ථිකයේ ප්‍රබල අංශයක් වූ අතර එක්සත් ජාතික පක්ෂ රජය පැවති කාලයේ එය මුළු ආසියාකරයේම වාර්තාගත ප්‍රගතියක් අත් කර ගත්තේය. සුළු ආයෝජකයන්ට ලක්ෂපතියන් වීමට මෙම කොටස් වෙළෙඳපොළින් වරම් ලැබිණි.

විදේශීය වාණිජ විශේෂඥයන්ට අප රටේ ආර්ථික ක්‍රියාදාමයට සම්මාදම් වීමට ඉඩ සලසමින් ආර්ථිකයේ දොරගුළු හැර නිදහස් ආර්ථික රටාවක් බිහි කළේ එක්සත් ජාතික පක්ෂය යි. එම ප්‍රතිපත්තිය අදත් අප රටේ අනුගමනය කිරීමෙන් එහි සඵලතාවත්, ඉන් අපට ලැබුණු මහඟු ඵල ප්‍රයෝජනත් මොනවට පැහිදිලි වෙයි.

නිලධාරීවාදයට කොටු වී සීමා බන්ධනවලට සිර වී තිබුණු අප රටේ ආර්ථික ක්‍රියාවලිය එම ග්‍රහණයෙන් මුදාලමින් සීඝ්‍ර ආර්ථික ප්‍රවර්ධනයකට ශක්තිමත් පදනමක් දැමීම නිසා වෙළඳපොළේ බලවේගයන් ප්‍රයෝජනයට ගෙන, ව්‍යවසායකයින් වශයෙන් තමන් සතු කුසලතා යොදාගෙන ධනය ඉපයීමට පොදුවේ කොයි කාටත් වරම් ලැබිණි. පදික වේදිකාවේ සුළු සුළු වෙළඳාම් කළ අයට පවා මෙම නිදහස් ආර්ථික ක්‍රියාවලිය ආශිර්වාදයක් විය. එම ප්‍රතිපත්තියේම තවත් වැදගත් අංගයක් හැටියට එක්සත් ජාතික පක්ෂය විසින් නිදහස් වෙළඳ කලාප ආරම්භ කරන ලදී. කටුනායක, බියගම සහ කොග්ගල පිහිටි මෙම නිදහස් වෙළඳ කලාපවල කම්හල් පිහිටුවා මූල්‍ය සම්පත්, නවීන යන්ත්‍ර සූත්‍ර හා දියුණු තාක්ෂණ ශිල්ප ක්‍රම යොදාගෙන, කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගතියට ඵලදායී ලෙස දායකවීමට විදේශ ආයෝජකයන් ඉදිරිපත් වීම නිසා දස දහස් ගණන් තරුණ තරුණියන්ට රැකියා අවස්ථා පෑදුණි.




මේ රටට විදේශ විනිමය උපයන උල්පතක් ව ඇති සංචාරක ව්‍යාපාරය එක්සත් ජාතික පක්ෂයේ සංකල්පයක් මත නිර්මාණය වූ නව ආර්ථික ක්‍රියාවලියකි. සංචාරක ක්ෂේත්‍රය ද විශාල රැකියා සංඛ්‍යාවක් සපයන ආර්ථික සම්පතක් වී ඇත.

වාණිජ හා වෙළඳ ක්ෂේත්‍රය ද එක්සත් ජාතික පක්ෂය විසින් පෙර නොවූ විරූ අන්දමට පුළුල් කර ජනතාවට ව්‍යාපාරික කටයුතුවල යෙදීමට අවශ්‍ය පහසුකම් ද වැඩි වැඩියෙන් සැපයුවේ ය. යටත්විජිත යුගයේ දී අප රටේ වෙළඳ ගනුදෙනු සිදු වූයේ එංගලන්තයත් සමඟ ය. එහෙත් එම රාමුව බිඳ දමා ඇමරිකාව, ජර්මනිය,

චීනය, ජපානය, කොරියාව, ඕස්ට්‍රේලියාව, මැද පෙරදිග රටවල් යනාදී දියුණු රටවල් සමඟ ද වෙළඳ ගනුදෙනු ආරම්භ කළේ එක්සත් ජාතික පක්ෂයයි.





සැලසුම් කළ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක සාර්ථකත්වය සහතික කිරීමට ගමනාගමන පහසුව සඳහා ප්‍රමාණවත්, දියුණු මාර්ග පද්ධතියක් තිබිය යුතුයි. ශ්‍රී ලංකාවේ මංමාවත් පද්ධතිය දියුණු කිරීමට ද එක්සත් ජාතික පක්ෂය පියවර ගත්තේ ය. ඒ සමග ම කොළඹ වරාය සහ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වැඩි දියුණු කර ජාත්‍යන්තර තත්ත්වයට ඒවායේ පහසුකම් ප්‍රවර්ධනය කළේ එක්සත් ජාතික පක්ෂය යි. අද කොළඹ වරාය අග්නිදිග ආසියාවේ ඉතාමත් ම කාර්යක්ෂම වූත්, පහසුකම් අතින් ඉතාමත් ම නවීන වූත් වරායක් හැටියට ලෝ පතල වී ඇත. කටුනායක ගුවන් තොටුපොළේ ප්‍රවර්ධනය නිසා ඉන් යන එන මගී සංඛ්‍යාවත්, එහි පැමිණෙන ගුවන් යානා සංඛ්‍යාවත් ඉහළ ගොස් ඇත. එපමණක් නොව, ගුවනින් භාණ්ඩ අපනයනයට විශේෂ පහසුකම් සැලසීම නිසා මල්, පලතුරු වැනි දේශීය භාණ්ඩ නිෂ්පාදකයින්ට හා නිදහස් වෙළඳ කලාපවල කර්මාන්ත ශාලාවලට විශාල යහපතක් සිදු විය.

ධීවර කර්මාන්තය දියුණු කිරීමටත්, ධීවරයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය දියුණු කිරීමටත් එක්සත් ජාතික පක්ෂ රජය විප්ලවීය සැලසුම් රැසක් ම ක්‍රියාත්මක කළේය. නිවාස හා ඉඩම්, විදුලිය, ඈත දියඹේ දින දෙක තුන ගත කළ හැකි නවීන ධීවර යාත්‍රා, අවුට් - බෝඩ් මෝටර් යන්ත්‍ර සපයා ධීවරයින්ගේ නිෂ්පාදන ශක්තිය දියුණු කිරීමට සාධනීය සැලසුම් ක්‍රියාත්මක කළ එක්සත් ජාතික පක්ෂය ඔවුන් වෙනුවෙන් ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් ද ආරම්භ කළේය. එපරිද්දෙන්ම එක්සත් ජාතික පක්ෂය යටතේ ආර්ථිකයේ සෑම සියලු අංශයක් ම නව ජීවයක් ලද්දේය. ඒ සමඟ ම ජනතාවගේ ජීවන තත්ත්වය ද ඉහළ ගියේය.

## විරැකියාවෙන් නිදහස

1977 න් පසු එක්සත් ජාතික පක්ෂය විසින් සපයන ලද රැකියා සංඛ්‍යාව ලක්ෂ ගණනාවකි. ඒ සමඟ ම තවත් ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ බලාපොරොත්තු හා අපේක්ෂා මුදුන් පත්වීම නිසා ඔවුන්ගේ ජීවිත සෞභාග්‍යයේ ආලෝකයෙන් කලඑළි විය. එය ද එක්සත් ජාතික පක්ෂයේ ප්‍රගති ප්‍රයත්නයේ විශිෂ්ට ප්‍රතිඵලයක් විය.

විදේශ රැකියා ලබාගැනීම සඳහා ගමේ ගොඩේ තරුණ තරුණියන්ට පවා අත හිත දී අවශ්‍ය පහසුකම් සැපයුවේ ද එක්සත් ජාතික පක්ෂය යි. මේ නිසා විශාල පිරිසකට පිටරටවල රැකියා කරමින් තම මව්බිමේත් දරු පවුල්වලත් සව්සිරියට දායකවීමට අවස්ථාව ලැබිණි.



ජාතික විදුලිය පද්ධතියට, මහවැලි ව්‍යාපාරය වැනි සංවර්ධන යෝජනා ක්‍රම මඟින් අලුතින් විදුලිය මෙගවොට් 1400 ක් සැපයීමෙන් එක්ත් ජාතික පක්ෂය ස්වයං රැකියා රැසකට පදනම දැමූ අතර ඈත එපිට ගැමි නිවෙස්වලට ද විදුලි බලයේ ආශිර්වාදය ලබාදුන්නේය.

ජාතියේ ප්‍රගතියට දායකවීමට සමත්, ප්‍රබුද්ධ තරුණ පරපුරක් බිහි කිරීමට ද එක්සත් ජාතික පක්ෂය පියවර ගත්තේය. ජාතික තරුණ සේවා සභාව මේ ප්‍රයත්නයේ සුවිශේෂ අංගයකි. එහි මූලික පරමාර්ථයක් වූයේ තරුණ තරුණියන්ගේ නායකත්ව කුසලතා මතුකර දීමයි.

ශ්‍රී ලංකාවට ක්‍රිකට් ලෝකයේ කීර්ති නාමයක් හිමි වූයේ එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය සමයේ දීය. ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ටෙස්ට් ක්‍රිකට් තරගවලට සහභාගීවීමේ වරම අපි ලබාගතිමු. මලල ක්‍රීඩා අංශයේ ද එවැනි ම විශිෂ්ට වාර්තා තබමින් අපේ ගැමි තරුණ තරුණියන්ට ජාත්‍යන්තර ක්‍රීඩා තරගවලට සහභාගී වී ස්වකීය කුසලතා තුළින් මවුබිමට කීර්තියක් අත්කර දීමට අපි අවස්ථාව උදාකර දුනිමු. රටේ ප්‍රධාන ප්‍රාදේශීය නගරවල මෙන්ම මහවැලි කලාපයේ බකමූණ සහ ගිරාඳුරුකෝට්ටේ වැනි නව ජනාවාසවල ද රජයේ අනුග්‍රහය ඇතිව ක්‍රීඩා උත්සව හා සංදර්ශන අද වාර්ෂික ජනතා උත්සව ලෙසින් පැවැත්වෙන්නේ එක්සත් ජාතික පක්ෂය ක්‍රීඩා අංශය දියුණු කිරීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි.

කාන්තා පරපුරේ විමුක්තියට මග හෙළි කරමින් සෑම ක්ෂේත්‍රයකම රැකියා අවස්ථා ඔවුන්ට උදාකර දුන්නේ එක්සත් ජාතික පක්ෂය යි. 1978 දී ස්ත්‍රීන් වෙනුවෙන් වෙනමම කාර්යාංශයක් සහ අමාත්‍යංශයක් ආරම්භ කළ අතර, 1993 මාර්තු මස 3 වන දින ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය සම්මත කරන ලදී. කාන්තාවන්ට එරෙහිව පවත්නා සියලු වෙනස්කම් දුරු කොට ඔවුන්ට අදාළ තීරණාත්මක ගැටළු නිරාකරණය කිරීම සහ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කම් මුලිනුපුටා දමා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම මෙම ප්‍රඥප්තියේ අරමුණ විය.

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ලංකාවට හඳුන්වා දුන් අතර, වනිතා දිරිපියස මධ්‍යස්ථාන ආරම්භ කිරීම, නෛතික ළමාරක්ෂණ පනත ගෙන ඒම, මව්වරුන්ගේ සහ දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය උසස් කිරීම සඳහා ගර්භනී මව්වරුන්ගේ සහ ළදරුවන්ගේ මන්දපෝෂණය අවම කිරීම වෙනුවෙන් නිරෝගී මාතා වැඩසටහන ක්‍රියාත්මක කර රුපියල් විසි දහසක පෝෂණ දීමනාවක් ලබාදීම ද එක්සත් ජාතික පක්ෂයේ ස්ත්‍රී හිතවාදී වැඩසටහන් ය. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සියයට 25 කින් වැඩි කිරීම ඔස්සේ දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය පුළුල් කරලීමට ද පියවර ගත්තෙමු.

පෞද්ගලික අංශයේ සේවකයින්ගේ අනාගත අභිවෘද්ධිය අපේක්ෂාවෙන් සේවක අර්ථසාධක අරමුදලක් පිහිටවූයේත්, ජනතාකරණය කළ රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල කොටස් සේවකයන්ට නොමිලයේ ලබාදුන්නේත් එක්සත් ජාතික පක්ෂය යි.

පාරිභෝගික ආරක්ෂක පනතක් පැනවීමටත් මවුවරුනගේ ප්‍රසූත නිවාඩුව දින 84 ක් දක්වා වැඩි කිරීමටත් එක්සත් ජාතික පක්ෂය පියවර ගත්තේය. ගැබිණි මව්වරුන්ගේ පෝෂණය වෙනුවෙන් විශේෂිත ක්‍රියා පිළිවෙත් දියත් කළේ ය.

# ලෙඩදුකින් නිදහස



නීරෝගී ජාතිය ශක්තිමත් ජාතියක් බව එක්සත් ජාතික පක්ෂයේ විශ්වාසය විය. ඒ අනුව ලෙඩ රෝග වැළැක්වීම හා තුරන් කිරීම එක්සත් ජාතික පක්ෂයේ සෞඛ්‍ය වැඩසටහන්වල ප්‍රධාන අරමුණ විය. මැලේරියා මාරයා සාර්ථකව දමනය කරන ලදී. ළදරු මරණ සංඛ්‍යාව සියයට 95 කින් පහත හෙළන ලදී. ලක්ෂ 50 කට අධික පිරිසකට පිරිසිදු පානීය ජලය සැපැයීමෙන් මූලික සෞඛ්‍ය ගැටළුවක් විසඳීමට සමත් වූ එක්සත් ජාතික පක්ෂය බෝවෙන රෝගවලින් හා පෝලියෝ වැනි වෙනත් ආබාධවලින් ජනතාවට ආරක්ෂාව දීම සඳහා දීපව්‍යාප්ත එන්නත් ව්‍යාපාර දියත් කරන ලදී. මූලික සෞඛ්‍ය සේවාවන් සැපැයීම හා රෝග වැළැක්වීම එක්සත් ජාතික පක්ෂ සෞඛ්‍ය සංවර්ධන ප්‍රයත්නයේ මූලික ලක්ෂණයක් විය. ග්‍රාමීය හා ප්‍රාදේශීය රෝහල් නවීකරණය කර අලුත් රෝහල් ආරම්භ කරන ලදී. කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර රෝහල අග්නිදිග ආසියාවේ නවීනතම ආරෝග්‍ය ශාලාවක් වෙයි. ඒ සමගම පෞද්ගලික අංශය උනන්දු කිරීම නිසා පෞද්ගලික ආරෝග්‍ය ශාලාද විශාල සංඛ්‍යාවක් බිහි විය.

ආයුර්වේදයේ දියුණුවට ද සුවිශේෂ සේවාවක් ඉටු කළ එක්සත් ජාතික පක්ෂයේ පාලන කාලය තුළදී ආයුර්වේද බෙහෙත් පිටරට යැවීම පවා ඇරඹිණි.

# ඒකාධිපති දමනය

මෑත ඉතිහාසයේ අප රට මුහුණ දුන් බරපතළ ම අභියෝගය වූ කලී ඒකාධිපති පවුල් පාලනයෙන් රට මුදවා ගැනීම ය. සකල විධ බලතල ජනාධිපති පදවිය යටතට ගොනු කර ගැනිණි. විධායක ජනාධිපති පදවිය ජීවිත කාලීන තනතුරක් බවට අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන සම්මත කර ගත් අතර, එය පරම්පරාවෙන් පරම්රාවට උරුම වන පවුලේ තනතුරක් බවට පත් කර ගත හැකි දේශපාලන පරිසරය ද සකස් කෙරිණි.

මුළු රටේ සමස්ත අයවැයෙන් 75% කට වඩා පවුලේ සාමාජිකයන් විසින් පාලනය කෙරෙන, පවුලට හා හිතවාදී හෙංචයියන්ට පමණක් සියළු බලතල, වරප්‍රසාද, හිමිකම් හා උරුමයන් බෙදී යන පාලනයක සිරකරුවන් බවට අවශේෂ මැති ඇමතිවරුන් පමණක් නොව, මුළු මහත් ජනතාව ද පත් විය.

මේ තත්වයෙන් රටත්, ජනතාවත්, මුදා ගැනීම සඳහා සිදු කෙරුණු ජනවාරි 08 වන දා විප්ලවයෙන් ජය ගැනීමට ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රමුඛ සකලවිධ ප්‍රගතිශීලී ජනතා බලවේයන්ට හැකි විණි. එහිදී එක්සත් ජාතික පක්ෂයේ සාමාජික සාමාජිකාවන් කළ කැපවීම අති මහත් ය.

අපි ඒකාධිපති පවුල් පාලනය පාරාජය කිරීමෙන් පමණක් නොනැවතී රටට හිතකර ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා පියවර ගත්තෙමු. 19 වන ආණ්ඩුක්‍රම සංශෝධනය හරහා ජනාධිපති විධායක බලතල සීමා කරමින්, පාර්ලිමේන්තුව තව තවත් ශක්තිමත් කළෙමු.

## බහුජන හිතාය බහුජන සුඛාය

වසර දහයක් තිස්සේ ක්‍රමක්‍රමයෙන් ව්‍යාප්ත වූ ඒකාධිපති පවුල් පාලනය මුළු මහත් ජාතියම ඉතිහාසයේ නොවූ විරූ අන්දමේ ණය උගුලක සිර කර තිබුණු අතර, ජනතා සහන මුළුමනින්ම පාහේ කප්පාදු කර තිබිණි.

මේ තත්වය අවබෝධ කරගත් යහපාලන ආණ්ඩුව සිය සංවර්ධන කාර්යයන් ඉදිරියට ගෙන ගියේ ජනතා සහන ගණනාවක් ද බෙදා හදා දෙමිනි.

විශ්‍රාමිකයින්ට රුපියල් 1000 ක් වැඩි කිරීම, රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම හා අවම වැටුප් තලයක් නියම කිරීම, සමෘද්ධි දීමනාව 200% කින් වැඩි කිරීම, මහපොළ ශිෂ්‍යත්ව දීමනාව රු. 1000 කින් වැඩි කිරීම, ගෑස් රු. 300 කින් අඩු කිරීම, කිරි පිටි රු. 61 කින් අඩු කිරීම, පාන් පිටි රු. 12.50 කින් අඩු කිරීම, සීනි රු.10කින් අඩු කිරීම, මුං ඇට රු. 40 කින් අඩු කිරීම, හාල්මැස්සන් රු. 15කින් අඩු කිරීම, සස්ටජන් රු. 100 කින් අඩු කිරීම, ටින් මාළු රු. 60 කින් අඩු කිරීම, උම්බලකඩ රු. 200 කින් අඩු කිරීම, මිරිස් රු. 25 කින් අඩු කිරීම, පෙට්‍රල් මිල රුපියල් 33 කින් අඩු කිරීම, ඩීසල් රුපියල් 16 කින් අඩු කිරීම, භූමිතෙල් රු. 32 කින් අඩු කිරීම, ගර්භනී මාතාවන්ට රු. 20,000 දීමනාවක් ලබාදීම, පෙර පාසල් ගුරුවරුන්ට මසකට රු. 250ක් හා දහම් පාසල් ගුරුවරුන්ට මසකට රු. 200ක දීමනාවක් ලබාදීම, වී ඇතුළු කෘෂි නිෂ්පාදන ගණනාවකට සහතික මිලක් ලබා දීම, අත්‍යවශ්‍ය භාණ්ඩ ගණනාවක් සඳහා පාලන මිල නියම කිරීම, රු. 100,000 දක්වා වන ගොවි ණයෙන් 50% කපා හැරීම, ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු සඳහා 15% පොළියක් ලබාදීම, විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 5000 සිට 1000 දක්වා අඩු කිරීම, ඒ අතරින් කීපයකි.

## ලිච්ඡවී ආණ්ඩු ක්‍රමය

අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්ව සම්මුතිවාදී ආණ්ඩුවක් පිහිටවූවෙමු. මෙය ලාංකේය දේශපාලන ඉතිහාසයට නවමු මෙන් ම සංකීර්ණ අත්දැකීමකි. තම තමන්ගේ දේශපාලන මතවාදයන්, අභිමතාර්ථ හා න්‍යාය පත්‍රයන් පසෙක ලා රටේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් එක ම මගක යෑමේ අභිලාෂය පෙරදැරිව ක්‍රියාත්මක කෙරන සම්මුතිවාදී ආණ්ඩුවේ මූලික පදනම ලිච්ඡවී රජ සිරිත යි. සමගියෙන් රැස්වී, සමගියෙන් සාකච්ඡා කොට, සමගියෙන් විසිර යෑමේ ලිච්ඡවී සිරිත අනුව පෙරට යන සම්මුතිවාදී ආණ්ඩුව නිසා දේශීය වශයෙන් පමණක් නොව ජාතන්තර වශයෙන් ද විශ්වාසය පුළුල් අන්දමින් ගොඩනැගෙමින් පැවතීම රටට බලවත් වාසියකි.

# යහපාලනය

මෑත ඉතිහාසයේ අප රට පැවති පාලන සම්ප්‍රදායයන් අපි මුළුමනින්ම වෙනස් කරමින්, මානව නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය යළි ඉහළට ඔසවා තැබූයෙමු. අධිකරණ පද්ධතිය වෙත හා රටේ අනෙකුත් සකල විධ ක්ෂේත්‍රයන් වෙත තිබූ දේශපාලන බලපෑම් සහමුලින්ම ඉවත් කළෙමු. ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කෙරුණු අතර, තොරතුරු දැන ගැනීමේ අයිතිය ද, අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බැලීමට පවුල්වල දෙමාපියන්ට හා ඥාතීන්ට ඇති අයිතිය ද තහවුරු කළෙමු. තිරසර සංවර්ධන පණත මගින් ශක්තිමත් සංවර්ධනයක් සහතික කරලීමට කටයුතු සකස් කෙරෙමින් පවතින අතර, මූල්‍ය විනය, විගණනය, බදු එකතුව ආදී අංශ ක්‍රමවත් කරලීමටත්, සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල නිසි මූල්‍ය කළමනාකරණයකට ලක් කොට එහි මුදල් සියයට සියයක් සුරක්ෂිත කරලීමටත් කටයුතු යෙදෙමින් පවතී.

පාලකයන්ට එක හැන්දකිනුත්, ජනතාවට තව හැන්දකිනුත් බෙදීමේ නීතිය දැන් ක්‍රියාත්මක නොවේ. වරදක් කළහොත් තරාතිරම කුමක් හෝ වේවා නීතිය ඉදිරියේ සමාන බව දැන් ප්‍රායෝගිකව ම ප්‍රදර්ශිතය.

# නොබෙදුණු දේශයක් ලොව පිළිගත් රාජ්‍යයක්

අපේ රට පිළිබඳව අප තුළ පමණක් නොව, ජාත්‍යන්තරය පුරා ද පැතිර තිබුණේ යහපත් ප්‍රතිරූපයක් නොවේ. අපි දිනෙන් දින මේ තත්වය වෙනස් කළෙමු.

දැන් අප රට පිළිබඳ පිළිගැනීම ඉහළ ය. ඕනෑම ජාත්‍යන්තර තලයකදී ශ්‍රී ලංකා යන නාමය අභිමානයෙන් යුතුව ප්‍රකාශ කිරීමේ පසුබිම දැන් සැකසී හමාර ය.

ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා භෞමික අඛණ්ඩතාව සුරැකෙන, සියළු ජනතාවට කිසිදු මදිපුංචිකමක් නොවන පරිදි හැකියාවෙන් හා දක්ෂතාවයෙන් ඉදිරියට යාමට පසුබිම සැකසෙන, පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් උදෙසා දැන් කටයුතු කරමින් සිටින්නෙමු.

# අඳුර දුරු කළ සොඳුරු අනාගතය

අපි යුරෝපීය මත්ස්‍ය තහනම ඉවත් කර ගතිමු. ජීඑස්පී ප්ලස් සහනය ලබා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම දැන් සකස් කර හමාරය. රට පුරා ඩිජිටල් විප්ලවයක් කරලමින්, අධ්‍යාපන, සෞඛ්‍ය හා තාක්ෂණ ක්ෂේත්‍රයන්හි දැවැන්ත ඉදිරි පිම්මක් සඳහා සැලසුම් ක්‍රියාත්මකය. මොරගහකන්ද වැනි ජලයෝජනා ව්‍යාපෘති, බස්නාහිර මෙගා පොලිස් වැනි මහා නගර සංවර්ධන ව්‍යාපෘති, අධිවේගී මාර්ග ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, කර්මාන්ත, සංචාරක හා මූල්‍ය කලාප ස්ථාපිත කරලීමේ ව්‍යාපෘති ඇතුළු මහා පරිමාණ ව්‍යාපෘති ගණනාවක් දේශයේ අනාගතය ඔපවත් කරලීම උදෙසා ක්‍රියාත්මක ය.

දකුණේ සංවර්ධන කාර්යයන් සඳහා දැන් මුලපුරමින් සිටින අතර, යුද්ධයෙන් දැවැන්ත පීඩාවට පත් වූ ප්‍රදේශයන්හි ජනජීවිතය යළි නගා සිටුවීමේ වැඩ කටයුතු සඳහා ද ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කරමින්, සමස්ත ශ්‍රී ලංකාව ඉන්දීය සාගරයේ ආර්ථික, වෙළඳ හා මූල්‍ය කේන්ද්‍රස්ථානය ලෙස ඉහළට ඔසවා තැබීමට අප ක්‍රියා කරන්නෙමු.

## අපේ පක්ෂය දේශයේ අනාගතය යි.

එක්සත් ජාතික පක්ෂය ඉටු කළ විප්ලවීය කාර්ය භාරය මෙසේ පිටු කීපයකට කැටි කළ නොහැකි ය. එය අපේ රටේ ඉතිහාසය පමණක් නොවේ. රටේ අනාගතය යි.

ඒ මහා ගමනට උරදුන් සියලු ම පක්ෂ සාමාජික සාමාජිකාවන්ට මාගේ ප්‍රණාමය පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. එසේ ම පක්ෂය වෙනුවෙන් ජීවිත පූජා කළ, දේපල හානි වුණ, අසාධාරණ මා මදිපුංචිකම්වලට ලක් වුණු සියල්ලන්ට සහන සැලසීමට ද අපි ක්‍රියා කරන්නෙමු. දේශපාලන පීඩාවන්ට ලක්වූ පාක්ෂිකයන්ට සාධාරණය ඉටු කරලීමේ මුල් අදියර දැන් ක්‍රියාත්මක ය. සියල්ලන්ට ම සාධරණය ඉෂ්ඨ කරලීමට අපි කැපවී ක්‍රියා කරන්නෙමු.

ජනතාවට විප්ලවීය ජයග්‍රහණ අත්පත් කර දුන් පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි. එය ජනතාවගේ පක්ෂයයි. එවන් පක්ෂයක සාමාජිකයන් වීම අපට අභිමානයකි.

එය අපේ පක්ෂය පමණක් ම නොවේ. එය අපේ අනාගතය යි.

එය අපේ ජීවන පිළිවෙත යි.

**කබීර් හෂීම්**
මහලේකම්.

# සම්මේලන යෝජනාව

## අපගේ මතවාදය

අපගේ උදාර පක්ෂය ආරම්භයේදී අරමුණු කර ගත් විදේශ ආධිපත්‍යයෙන් නිදහස, අවිද්‍යාවෙන් නිදහස, අගහඟකමින් නිදහස, විරැකියාවෙන් නිදහස, ලෙඩ දුකින් නිදහස යන සකල විධ නිදහස ජනතාවට ලබා දීමේ ව්‍යායාමය හැකි ශක්ති ප්‍රමාණයෙන් සාර්ථක කර ගැනීමට හැකි වීම සම්බන්ධව සතුටු වන අතර, එහිදී මුදුන්පත් කර ගැනීමට නොහැකි වූ ඉලක්ක මෙන්ම, වත්මන් සමාජ ආර්ථික තත්වයන් හා තාක්ෂණික නව ප්‍රවණතා හමුවේ මතුවන නව අපේක්ෂාවන් ද ජය ගැනීමට හැකිවන අයුරින්, අතීත අත්දැකීම්, වර්තමාන හැකියාවන් සහ අනාගත අපේක්ෂාවන් සියල්ල ගැඹුරින් විමසමින්, අපගේ දේශයේ අනාගතය අසිරිමත් කරලීම උදෙසා මතු දැක්වෙන අරමුණු, අපේක්ෂා සහ සංකල්ප දියත් කිරීමට අපගේ උදාර පක්ෂයේ 70 වන සංවත්සරයේදී යෝජනා සම්මත කරන්නෙමු.

අප පක්ෂයේ නිර්මාතෘ ඩී එස් සේනානායක ශ්‍රීමතාණන්, පක්ෂ ආරම්භක රැස්වීමේදී සඳහන් කළ පරිදි, සිංහල හෝ වේවා, දෙමළ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා, බර්ගර් හෝ වේවා, වෙනත් ජනවර්ගයක හෝ වේවා, සියලු ශ්‍රී ලාංකිකයන්ගේ එකමුතුව මත, ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කරලීමට ද;

කිසිදු විදේශීය බලවේගයකට, දේශයේ ස්වාධිපත්‍යය සහ ජනතාවගේ පරමාධිපත්‍යය යටපත් කිරීමට, හෑල්ලු කිරීමට හෝ බලපෑම් කිරීමට ඉඩ නොදීමට ද,

බහුතර සිංහල ජනතාවගේ සාඩම්බර උරුමය හා සංස්කෘතිය තව තවත් ඔප් නංවාලීමට හා ඔවුන් සමග ශතවර්ෂ ගණනාවක් එකට සම්බන්ධව ලක්මව පෝෂණය කළ දෙමළ, මුස්ලිම් හා අනෙකුත් ජනවර්ගයන් ගේ උරුමයන් හා සංස්කෘතීන් ආරක්ෂා කරමින්, සියළු ජනවර්ගයන්ට සහෝදරත්වයෙන් හා සමගියෙන් ජීවත් විය හැකි තිරසාර සමාජ පරිසරයක් නිර්මාණය කරලීම සඳහා නිරන්තරව ක්‍රියා කරලීමට ද,

වසර දෙදහස් පන්සියයකටත් එහා දිවෙන අභිමානනීය ඉතිහාසයක උරුමකරුවන් ලෙස, බෞද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබාදෙමින්, ථෙරවාද බුදුදහමෙහි කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පත් කරලීමට ද, එසේම හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ආදී අප රට පවත්නා සෙසු ආගම් ද, අනුගමනය කිරීමේ, ඇදහීමේ හා විශ්වාස කිරීමේ අයිතිය තහවුරු කිරීමට ද,

අධිකරණයේ පරම ස්වෛරීත්වය තහවුරු වුණු, සිතීමේ, ඇදහීමේ, අදහස් ප්‍රකාශ කිරීමේ ස්වර්ණමය පුද්ගල නිදහස හා අයිතිය සාක්ෂාත් වුණු, සුදුස්සාට සුදුසු තැන සැබවින්ම හිමි කර දෙන්නට නොමැලි වන, බිම් මට්ටමේ සිට රට පුරා ගම්බිම්වල වෙසෙන සියල්ලන්ගේ බේදයකින් තොර ජන සහභාගීත්වය ඇති, කවරෙකු අතර වුව පැවතිය හැකි පටු ආකල්පමය වෙනස්කම් අකා මකා ලූ යහපාලනයක් මේ රන් දේශය මත ස්ථාපනය කරලීමට ද;

ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින්, තරගකාරී වෙළඳපොළ ආර්ථිකය, රජයේ සර්ව පාලනය යටතේ පවත්වාගෙන යමින්, ආර්ථික හා සමාජ ප්‍රතිලාභ මහජනතාවට සාධාරණ ලෙස බෙදී යන, දැනුම පදනම් කරගත් තරගකාරී වෙළඳපොළ ආර්ථිකයක් නිර්මාණය කිරීමට ද,

ඒ ඔස්සේ පාසල් නොයන දරුවකු නැති, කුසට අහරක් නොමැතිව වේලක් ගෙවන දරු පවුලක් නොසිටින, රැකියාවක් නොලබා පොළොවට බරක් ව සිටිනා යෞවනයකු නොදකින, ඉසුරුමත් දේශයක් බිහි කිරීමට ද;

සෑම පවුලකටම නිවසක් හිමි වූ විට, සෑම පවුලක්ම වත්කම්වලින් සවිමත් වූ විට ඒ පවුල ආරක්ෂා වන බවත්, දරුවන්ගේ අධ්‍යාපනය තහවුරු වන බවත්, සතුට ඉස්මතු වන බවත්, එමගින් පොදුවේ තෘප්තිමත් සමාජයක් බිහි වන බව මෙන් ම, මධ්‍යම පංතිය පුළුල්වීමේ වැදගත්කම ද හොඳින් දැන හැඳින, එවන් සමාජයක් බිහි කිරීමේ සාධකයන් නිර්මාණය කිරීමට ද;

නාගරික මධ්‍යම පන්තියට වුවමනා මූල්‍ය සහාය හා අඩු ආදායම් ඇති නාගරික පවුල්වලට වුවමනා නිවාස මෙන්ම වතුකරයේ ජීවත් වෙමින් ජීවිකාවේ නියුතු සෑම පවුලකටම ද නිවහනක් ලබාදීමට ද;

දැනට බලපත්‍ර යටතේ රජයේ ඉඩම් හා නිවාසයන් හි පදිංචිව සිටින ලක්ෂ විස්සකට අධික ජනතාවට සින්නක්කර ඉඩම් අයිතිය හා නිවාස හිමිකම ලබා දීමෙන්, නිවාස සහ ඉඩම් හිමි නව ප්‍රජාවක් නිර්මාණය කිරීමට ද;

ග්‍රාමීය ආර්ථිකය යළි නඟා සිටුවා, මෙරට කෘෂි අර්ථ රටාව, හුදෙක් කන්නයෙන් කන්නයට යැපීමට පමණක් නොව, ජීවන අභිවෘද්ධියට ද සවියක් වූ, ඉහළ ආදායම් උපදන, ඵලදායී වෘත්තීය ක්ෂේත්‍රයක් බවට පත් කරවමින්, කෘෂි ක්ෂේත්‍රය නවීකරණය කිරීම ඔස්සේ කෘෂි ඵලදායීතාව වැඩි කරලීමටත්, කෘෂි අපනයනය ඉහළ නැංවීමටත්, ග්‍රාම රාජ්‍ය සංකල්පය යටතේ ගම ආර්ථික සංවර්ධිත කේන්ද්‍රස්ථානයක් ලෙස ගොඩ නැංවීමට ද;

දශක ගණනාවක යුද්ධයෙන් පීඩිතව සිට හිස ඔසොවන උතුරු නැගෙනහිර ප්‍රදේශයන් හි ජන ජීවිතය හා ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වය යහපත් අතට හැරවීමට ද;

ස්ත්‍රී පුරුෂ සමාජ සාධාරණත්වය හා සමානත්වය පිළිබඳ පක්ෂ ස්ථාවරය යළි සහතික කරමින්, තිරසාර සංවර්ධනය, සමාජ සාධාරණත්වය, සාමය හා ආරක්ෂාව යන ජාතික ප්‍රතිපත්ති ක්‍රියාවලියක් තුළ ශ්‍රී ලංකාවේ කාන්තාවන් හට සාවල්‍ය බලගැන්වීමක් ලබා දීමට කැපවෙමින්, ස්ත්‍රීන්ට සාධාරණත්වය සහ සමානාත්මතාවය වෙනුවෙන් දායකත්වය ලබා දෙන සියලු ආයතන සහ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමට, ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනය කිරීම සඳහා පසුබිම සැකසීමට, ස්ත්‍රීන්ගේ ආර්ථික බලගැන්වීම සඳහා දායකත්වය ලබා දීමට, ස්ත්‍රීන් හා ගැහැනු දරුවන් මුහුණ දෙන හිංසනය තුරන් කිරීම හා ඒ සම්බන්ධයෙන් නීතිමය ප්‍රතිපාදන නිසි ලෙස ශක්තිමත් කිරීම හා ස්ථාපිත කිරීමට සහ කාන්තා ගෘහමූලික පවුල් සඳහා ජීවනෝපාය ගොඩනඟා ගැනීම සහ ස්ථාපිත කිරීම සඳහා දායකත්වය දැක්වීමට ද;

විස්තීර්ණ තරගකාරී ආර්ථික ලෝකයේ, අග්නිදිග ආසියාවේ ඉහළම තලයක් කරා එළැඹීමේ සැලසුම් ක්‍රියාත්මක කරමින්, නාවුක වෙළඳාම හා වරාය ආශ්‍රිත

භාණ්ඩ හුවමාරුව හා නිශ්කාෂණය අතින්, ඉහළ ගුණාත්මක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අතින්, අපනයන හා ආනයන ආදේශන නිපදවීම අතින් මෙන්ම රැකියා උත්පාදනය අතින් අප මාතෘ භූමිය ඉන්දියන් සාගරයේ වඩාත්ම උද්යෝගී කේන්ද්‍රස්ථානය බවට පත්කිරීමට ද;

රටේ සෑම දරුවෙකුටම, අවම වශයෙන් වසර 13 ක අධ්‍යාපනයක් අනිවාර්ය කර, ඒ ඔස්සේ, සෑම දරුවෙකුටම විශ්වවිද්‍යාලමය, තෘතීයික, වෘත්තීයමය හෝ තාක්ෂණික අධ්‍යාපනක් සලසා කාටත් ඉහළ ආදායම් ඉපයිය හැකි දිනක් නොපමාව උදා කරන්නට වෙර ගන්නෙමු. ඒ මාවතේ දී, නිදහස් අධ්‍යාපනය වඩ වඩාත් සුරකිමින් ද, සෑම දරුවෙකුටම වසර 13 ක අධ්‍යාපනය තහවුරු කරමින් ද, නිදහස් අධ්‍යාපනය සඳහා වෙන් කෙරෙන ආයෝජන වාර්ෂිකව වර්ධනය කරමින් ද, නව ප්‍රවණතාවන්ට ගැලපෙන අයුරින් අධ්‍යාපන අවස්ථාවන් හා අවකාශයන් තව තවත් පුළුල් කරලීම ඔස්සේ නවඋත්පාදන සාර්වත්‍ර උපාය මාර්ගය ශක්තිමත් කිරීමට ද;

වර්තමානයෙහි වසංගතයක් වී ඇති බෝ නොවන රෝග මර්දනය කිරීම සඳහා විධිමත් සුව සේවා සහ පෝෂණ ක්‍රියාවලියක් දිරිගන්වන්නෙමු. ක්‍රීඩාශීලී සුව සම්පන්න ජනතාවක් බිහිකරලීමට නිදහස් සෞඛ්‍ය සේවාව ශක්තිමත් කරලීමට ද;

දේශපාලනඥයන් සුළු පිරිසකගේ සහයෝගය මත කූට ව්‍යාපාරිකයන් රැළක් විසින් ජාත්‍යන්තර ජාලයන් හා සම්බන්ධව පවත්වාගෙන යන මත්ද්‍රව්‍ය ප්‍රවාහන වැඩ පිළිවෙල සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය කිරීමටත්, දේශීය මත්ද්‍රව්‍ය සංසරණය මුලිනුපුටා දැමීමටත් දැඩි පියවර ගන්නා අතර, මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කොට සමාජයට වැඩදායක පුරවැසියන් බවට පත් කරලීමේ ක්‍රමවේදයක් ද සැකසීමට ද;

අපගේ වටිනා සාගර සම්පත, වායු, ජල හා පාංශු සම්පත රැකගනිමින්, ජීව විවිධත්වය ආරක්ෂා කරමින්, ලොවටම ආදර්ශයක් වන හරිත තිරසර සංවර්ධනයකට දිගුකාලීනව රට සූදානම් කරලීමට ද;

දේශය පෝෂණය කළ සිංහල සංස්කෘතිය හා කලා ශිල්ප ආරක්ෂා කරලන අතර, දෙමළ සහ මුස්ලිම් ආදී අනෙකුත් ජනවර්ගයන්ගේ සංස්කෘතීන් ඔස්සේ දේශය ලැබූ ආලෝකය පිළිගනිමින්, සියළු සංස්කෘතීන් හා සම්ප්‍රදායන් වර්ධනය කරලීමේ අවකාශ පුළුල් කිරීමට හා එකිනෙකට ගරු කරන සමාජ පසුබිමක් සැකසීමට ද;

මිනිසා හුදු ආර්ථික සත්වයෙකු පමණක් නොව සංස්කෘතික සත්වයෙක් ද බව පිළිගන්නා අතර, සාහිත්‍යය, කලාව, සමාජ මාධ්‍ය ජාල සඳහා අවකාශ පුළුල් කරමින්, අනාගතයේ සුහුරු මිනිසෙකු සහ සුහුරු රටක් නිර්මාණය කිරීමට ද; කැපවෙමින්,

එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරමින් මහාමාන්‍ය ඩී එස් සේනානායකයන් සඳහන් කළ; "එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය ජාතිභේද වාදී විය නොහැක. මක්නිසාද එහි සෑම ජාතියකට ද, සෑම ආගමකට ද, අයත් සාමාජිකයන් සිටින හෙයිනි. අපේ ප්‍රතිපත්තිය විශේෂ කල්පනාවක් මත පදනම් වූවකි. එනම් ජාති භේදවාදී නොවූ දිවයිනේ ආර්ථික අවශ්‍යතාවන් පිළිබඳ අදහසයි." යන මතය ආරක්ෂා කිරීමටත්,

1962 වසරේ කළුතර පක්ෂ සම්මේලනයේ දී සම්මත කර ගත් අපේ විශ්වාසය ඔස්සේ ගොඩ නැංවෙන අපේ දර්ශනය පිළිබඳ මතු දැක්වෙන යෝජනාව;

"අ). වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හා උපන් ස්ථානය නොතකා සියලු දෙනාටම සමසේ සැලකීම.

ආ) තමන්ගේ හැකියාවන් අනුව උසස් තත්ත්වයක් කරා එළඹෙන්නට සියලු දෙනාටම සම අවස්ථාවන් සලසා දීම.

ඇ) ජීවිතයේ සෑම අංශයකින්ම සමාන අවස්ථාවන් ලබාගත හැකි වන පරිද්දෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් එකම තලයකට ගෙන ඒම පිණිස ස්ත්‍රීන්ගේ තත්ත්වය උසස් බවට පත් කිරීම.

ඈ) සමාජ අසාධාරණත්වයන් නිවැරදි කිරීම සහ දුගී බව තුළ ජීවත්වන්නවුන්ට වඩාත් ප්‍රබෝධමත් ජීවිත ඇති කර ගැනීම සඳහා අවස්ථාවන් සලසා දීම.

ඉ) සියලුම පුරවැසියනට ආහාර, ඇඳුම්, නිවාස, අධ්‍යාපනය හා සෞඛ්‍ය වැනි මූලික අවශ්‍යතාවන් ලැබෙන පරිද්දෙන් ප්‍රමාණවත් ජීවන මට්ටමක් ලබාදීම.

ඊ) ආණ්ඩු පාලනය උදෙසා ජනතා සහභාගීත්වය ලබා ගැනීම සහ නගර සහ ගම්මාන සංවර්ධනයේ දී ඒවායේ වාසය කරන ජන කොටස් එම සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීම.

උ) ජනතාවට සෞභාග්‍යය ළඟා කර ගැනීමට සහ තමන්ගේ ආදායම් මට්ටම ඉහළ නංවා ගැනීමට වැඩි වැඩියෙන් අවස්ථා උදා කර ගැනීම සඳහා ඉඩකඩ සලසන්නා වූ පුද්ගල ස්වප්‍රයත්නයන් ප්‍රවර්ධනය කිරීම.

ඌ) සියලු දෙනාටම රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

එ) කවර ආකාරයකින් හෝ දේපළ අයිතියක්, එනම් ඉතා කුඩා ව්‍යාපාරයක් හෝ වේවා, කුඩා නිවසක් හෝ වේවා, කුඩා ඉඩමක් හෝ වේවා, ඉතිරි කිරීමේ ගිණුමක හෝ ව්‍යවසායක කොටස් හෝ වේවා, පුරවැසියකු සතු වේ නම් එපමණින්ම ඔහු හෝ ඇය නිදහස් හා ස්වාධීන පුද්ගලයකු වන බැවින්, දේපළ අයිතිය භුක්ති විඳීම කෝටි සංඛ්‍යාත ජනතාව අතර ව්‍යාප්ත කොට පුරවැසියන්ගේ අදීන භාවය ඉහළ නැංවීම. මගින්,

රැකියා, ධනය හා සෞභාග්‍යය ආදී ප්‍රබල ශක්තීන් නිර්මාණය කරන්නාවූද, දේශපාලන හා ආර්ථික බලය පුළුල් ලෙස ව්‍යාප්ත වීම සහතික කරන්නා වූද, ජනතාවගේ ආගමික හා සංස්කෘතික අභිලාෂයන් මුදුන්පත් කරලීමට අවකාශ සලසන්නා වූද, දුගී බවින් තොර වූද, නිවැරදි දියුණුවීමේ අභිලාෂයන්ට රුකුල් දෙන්නා වූද, අලුත් දෙයක් කිරීම සඳහා කෙරෙන ප්‍රයත්නයන්ට අනුබල දෙන්නා වූද, සම්‍යක් ව්‍යායාමයන්ට ජයග්‍රහණය ලබා දෙන්නා වූද, නිදහස් ස්ත්‍රී පුරුෂයන්ගෙන් සැදුම්ලත් නිවහල් සමාජයක් බිහි කිරීම මෙම විශ්වාසයන් මගින් ගොඩනැගෙන්නා වූ දර්ශනයයි." යන්න යළි තහවුරු කිරීමටත්,

1977 මැතිවරණ ප්‍රකාශයේ සඳහන් "අපට ඕනෑ කරන්නේ මේ රට නිදහස් ජනතාවගේ ක්ෂේම භූමියක් කිරීමයි. අපට ඕනෑ කරන්නේ ජනතා ප්‍රාර්ථනා නිසි පරිදි සපුරාලීමට මං සැලසීමයි. අපට ඕනෑ කරන්නේ නිසි ප්‍රයත්නයන්ට අනුබල දී සම්‍යක් ව්‍යායාමය ජයග්‍රහණය කරනු දැකීමයි.

ශ්‍රී ලංකාවාසී තරුණ පරපුර අදට වඩා සැපවත් අනාගතයක අඩිතාලම දැමෙන පරිද්දෙන් කාර්යක්ෂමවූත්, දූෂණයෙන් තොරවූත්, දේශපාලන සංකල්පනා කෙබඳු වුවත්, සෑම දෙනාට ම සාධාරණය හා සෞභාග්‍යය උදා කර දෙන්නාවූත්, රජයක් ලබා දීම අපේ පරම උත්සාහය වන්නේය" යන්න යළි අවධාරණය කිරීමටත්, ප්‍රතිඥා දෙමින්,

අප පක්ෂය බිහි කරලීමේ දී පදනම් වූ ශ්‍රී ලාංකේය අනන්‍යතාව සහ ජාතික සංහිඳියාව නිරන්තරයෙන් ම ආරක්ෂා කිරීමට,

දේශපාලනික හා සමාජමය වශයෙන් ජාතිය බෙදී ඉහිර යා නොදෙනු පිණිස, අප සතු වටිනාකම් සැවොම සම සේ බෙදා හදා ගෙන එම වටිනාකම්වල සම හිමිකරුවන් ලෙස ආඩම්බර වන ජාතියක් බිහි කරලීමට, සහ

කවර හෝ භේදයකින් තොර, සැවොම සමාන, සාධාරණ, යුක්ති යුක්ත සමාජ පසුබිමක, ජාතික සමගිය හා සංහිඳියාව රජයන සෞභාග්‍යමත් දේශයක් ගොඩනැංවීම උදෙසා අධිශ්ඨානශීලීව වෙහෙසීමට හා කැපවීමට මෙන්ම,

ඊට අවශ්‍ය ප්‍රතිපත්ති, යෝජනා සහ සැලසුම් සකස් කිරීමට අවශ්‍ය බලය කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියට යටත්ව ගරු නායකතුමන් වෙත පැවරිය යුතු බවටත්, එම කටයුතු පිළිබඳව කාලානුරූපව සම්මේලනයට වාර්තා කළ යුතු බවටත් අපේ අභිමානවත් පක්ෂයේ 70 වන සංවත්සරයේ දී යෝජනා කර සිටින්නෙමු.

## ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා අප ශ්‍රී ....... ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී - සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අප හට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා

අප ශ්‍රී..... ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ මය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ - නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින - රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර දා - නමෝ නමෝ මාතා
අප ශ්‍රී...... ලංකා නමෝ නමෝ නමෝ නමෝ මාතා
....................

ஸ்ரீ லங்கா மாதா அப ஸ்ரீ...... லங்கா நமோ நமோ நமோ நமோ மாதா
சுந்தர சிரிபரணி சுரத்தி அதி சோபமான லங்கா
டான்ய டனய நெக்க மல் பழத்துறு பிரி ஜய பூமிய ரம்யா
அப க(ட்)ட சப சிறி செத்த சதனா ஜீவனயே மாதா
பிழிகனு மன அப பக்தி பூஜா
நமோ நமோ மாதா
அப ஸ்ரீ...... லங்கா நமோ நமோ நமோ நமோ மாதா
ஒப வே அப வித்யா
ஒப மய அப சத்யா
ஒபவே அப சக்தி
அப கத துழ பக்தி
ஒப அப ஆலோகே
அபகே அனுப்புறாணே
ஒப அப ஜீவன வே
அப முக்திய ஒப வே
நவ ஜீவன தெமினே நிதின அப புபுது கரன் மாதா
ஞான வீர்ய வடவமின ரெகென யனு மன ஜய பூமி கறா
எக மவக்ககே தறு கல பவினா
யமு யமு வீ நொபமா
ப்ரேம வடா சம பேத தூறாற தா நமோ நமோ மாதா
அப ஸ்ரீ......லங்கா நமோ நமோ நமோ நமோ மாதா

## தேசிய கீதம்

ஸ்ரீ லங்கா தாயே – நம் ஸ்ரீ லங்கா – நமோ நமோ நமோ நமோ தாயே
நல்லெழில் பொலி சீரணி – நலங்கள் யாவும் நிறை வான்மணி லங்கா
ஞாலம் புகழ் வள வயல் நதி மலை மலர் – நறுஞ்சோலை கொள் லங்கா
நமதுறு புகலிடம் என ஒளிர்வாய் – நமதுதி ஏல் தாயே
நமதலை நினதடி மேல் வைத்தோமே – நமதுயிரே தாயே – நம் ஸ்ரீ லங்கா
நமோ நமோ நமோ நமோ தாயே – நமதாரருள் ஆனாய்
நவை தவிர் உணர்வானாய் – நமதேோர் வலியானாய்
நவில் சுதந்திரம் ஆனாய் – நமதிளமையை நாட்டே
நது மடி தனையோட்டே – அமைவுறும் அறிவுடனே
அடல்செறி துணிவருளே – நம் ஸ்ரீ லங்கா
நமோ நமோ நமோ நமோ தாயே – நமதோர் ஒளி வளமே
நறிய மலர் என நிலவும் தாயே – யாமெல்லாம் ஒரு கருணை அனைபயந்த
எழில்கொள் சேய்கள் எனவே – இயலுறு பிளவுகள் தமை அறவே
இழிவென நீக்கிடுவோம் – ஈழ சிரோமணி வாழ்வுறு பூமணி
நமோ நமோ தாயே – நம் ஸ்ரீ லங்கா
நமோ நமோ நமோ நமோ தாயே

ශ්‍රී ලංකා තායේ - නම් ශ්‍රී ලංකා - නමෝ නමෝ නමෝ තායේ

නල්ලෙලිල් පො... ශිරනි - නලංගල් යාවුම් නිරෙ වාන්මනි ලංකා
ඥානම් පුකල් වලවයල් නදි මලෙ මලර් - නරුන්චෝලෙ කොල් ලංකා
නමදුරු පුහලිඩම් එන ඔලිර්වායි - නම තුදි ඒල් තායේ
නමදලෙ නිනතඩි මේල් වෛත්... මේ - නමදුයිරේ තායේ - නම් ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ තායේ

නමතාරරුල් ආනායි - නවෛ තමිර් උණර්වානායි
නමතෝර් වලියානායි - නවිල් සුදන්දිරම් ආනායි
නමදිලමෛයෙ නාට්ටේ - නකු මඩි තනෛයෝට්ටේ
අමෛයිවුරුම් අරිවුඩනේ - අඩල්ශෙරි තුනිවරුළේ - නම් ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ තායේ

නමතෝර් ඔලිවලමේ - නරිය මලර් එන නිලවුම් තායේ
යාමෙලාම් ඔරු කරුනෛ අනෛයිපයන්ද - එළිල්කොල් ශෙයිහල් එනවේ
ඉයලුරු පිලවුහල් තමෛ අරවේ - ඉලිවෙන නීක්කිඩුවෝම්
ඊළ ශිරෝමණි වාල්වුරු පූමනි - නමෝ නමෝ තායේ - නම් ශ්‍රී ලංකා
නමෝ නමෝ නමෝ තායේ

## එක්සත් ජාතික පක්ෂ ගීතය

සම්පත් සාදන ලංකා ධරණී තලේ
එක්සත් ජාතික පක්ෂය අපියි රටේ
සිංහල දෙමළ ද මුස්ලිම් බර්ගර් අපි එක මිනිස් කුලේ
එක්සේසත් කළ එක්සත් ජාතික පක්ෂය අපියි අපේ

පන්සල පල්ලිය කෝවිල ඇසුරින් සංවර සිතුවිලි ධර්ම සුගන්ධේ
සාමය සමගිය සමෘද්ධියේ
ශිල්ප කලා විදු ඥාණ ගුණෝපිත
ජය ගී නංවමු යුගෙන් යුගේ

එක්සේසත් කළ එක්සත් ජාතික පක්ෂය අපියි අපේ

අතීත එඩිතර තේජ විරාජිත
ඈතා අපේ සලකුණ අපරාජිත
ඡන්ද බලය අපි දිනන බලේ
උදාර නිදහස අපට උදා කළ
සදා රකිමු ජන සවිය වඩා

එක්සේසත් කළ එක්සත් ජාතික පක්ෂය අපියි අපේ

කෙත්වතු ගොවිපල කම්හල වැඩපල
දහදිය බිඳු මත නංවමු නව ලොව
නිවහල් අභිමන් උදානයේ

එක් ධජයක් යට හෙට නොව අද අද
පුරවාලමු යස ඉසුරු රටේ

සම්පත් සාදන ලංකා ධරණී තලේ
එක්සත් ජාතික පක්ෂය අපියි රටේ
සිංහල දෙමළ ද මුස්ලිම් බර්ගර් අපි එක මිනිස් කුලේ

එක්සේසත් කළ එක්සත් ජාතික පක්ෂය අපියි අපේ
එක්සේසත් කළ එක්සත් ජාතික පක්ෂය අපියි අපේ
එක්සේසත් කළ එක්සත් ජාතික පක්ෂය අපියි අපේ........ ।

## එක්සත් ජාතික පක්ෂ නිලධාරි මණ්ඩලය 2016

ගරු නායක - ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා
ගරු නියෝජ්‍ය නායක - ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා
ගරු උප නායක - ගරු අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා
ගරු සභාපති - ගරු අමාත්‍ය මලික් සමරවික්‍රම මැතිතුමා
ගරු ලේකම් - ගරු අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමා
ගරු භාණ්ඩාගාරික - ගරු නියෝජ්‍ය අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මැතිතුමා
ජ්‍යෙෂ්ඨ උප සභාපති - ගරු අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා
උප සභාපති - ගරු අමාත්‍ය ඩී. එම්. ස්වාමිනාදන් මැතිතුමා
උප සභාපති - රේණුකා හේරත් මැතිනිය (ප. ස. වි. නා)
උප සභාපති - ගරු අමාත්‍ය දයා ගමගේ මැතිතුමා
පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක -
ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා
නියෝජ්‍ය මහලේකම් - ගරු අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමා (ජ. නි)
ප්‍රතිපත්ති පර්යේෂණ ඒකකයේ සභාපති - ගරු අමාත්‍ය විජේදාස රාජපක්ෂ මැතිතුමා
නීති ලේකම් - නීතිඥ නිශ්ශංක නානායක්කාර මැතිතුමා
ලේකම් ජාත්‍යන්තර කටයුතු - ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා
ජාතික සංවිධායක - නීතිඥ මහින්ද හාරදාස මැතිතුමා
සහකාර ලේකම් - ගරු අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමා
සහකාර ලේකම් - ගරු අමාත්‍ය හර්ෂ ද සිල්වා මැතිතුමා (පා.ම)
ජාතික යොවුන් පෙරමුණේ සභාපති - ගරු කාවින්ද ජයවර්ධන මැතිතුමා (පා. ම.)
ලක්වනිතා පෙරමුණේ සභාපතිනි - ගරු අමාත්‍ය අනෝමා ගමගේ මැතිතුමිය
ගරු අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා
ගරු රාජ්‍ය අමාත්‍ය පාලිත රංගේ බණ්ඩාර මැතිතුමා
ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා
චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා
ගරු අමාත්‍ය නවීන් දිසානායක මැතිතුමා
මංජු ශ්‍රී අරංගල මැතිතුමා (ප.වි.නා)
එස්. තෙන්නකෝන් නිලමේ මැතිතුමා (ප.වි. නා)
ප්‍රසන්න ශසල් සෙනරත් මැතිතුමා (ප. වි. නා)
ඩබ්. සෝමදාස මැතිතුමා (ප.වි.නා)
අනිල් රත්නායක මැතිතුමා (ප. වි.නා)
ඒ.ජේ.එම්. මුසම්මිල් මැතිතුමා (හිටපු නගරාධිපති)
ගරු එඩ්වඩ් ගුණසේකර මැතිතුමා (පා.ම.)
ගරු ලක්ෂ්මන් විජේමාන්න මහතා (පා.ම.)
ගරු අමාත්‍ය ඒ.එච්.එම්. නලීම් මැතිතුමා
ගරු රාජ්‍ය අමාත්‍ය වසන්ත අලුවිහාරේ මැතිතුමා
ගරු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා
ගරු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා
ගරු රාජ්‍ය අමාත්‍ය දිලිප් වෙදආරච්චි මැතිතුමා
ගරු අමාත්‍ය නිරෝෂන් පෙරේරා මැතිතුමා
ගරු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා
ගරු අමාත්‍ය හරින් ප්‍රනාන්දු මැතිතුමා

ගරු අමාත්‍ය පී. හැරිසන් මැතිතුමා
ගරු රාජ්‍ය අමාත්‍ය වසන්ත සේනානායක මැතිතුමා
ගරු අමාත්‍ය තලතා අතුකෝරළ මැතිතුමිය
ගරු රාජ්‍ය අමාත්‍ය ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මැතිතුමා
ගරු රාජ්‍ය අමාත්‍ය විජේකලා මහේෂ්වරන් මැතිතුමිය
නිහාල් ලියනාරච්චි මැතිතුමා
ඒ.ඒ.ඩී. ලලිත් ඉන්දික අසන්ත මැතිතුමා
එස්.පී. පත්බේරිය මැතිතුමා (හිටපු නාගරික මන්ත්‍රී)
ඩබ්.එම්. ධම්මිකා කුමාරි මහත්මිය
ගරු අමාත්‍ය ජෝන් ඒ.ඊ. අමරතුංග මැතිතුමා
ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා (හිටපු අමාත්‍ය)
චානක ද සිල්වා මැතිතුමා
ගරු තිලක් මාරපන මැතිතුමා (ජ. නී.) (පා.ම)
සුනේත්‍රා රණසිංහ මැතිතුමිය (හිටපු නාගරික මන්ත්‍රිනී)
ගරු සිරිනාල් ද මෙල් මැතිතුමා (පා. ම.)
ගරු අමාත්‍ය චන්ද්‍රානි බණ්ඩාර මැතිනිය
ගරු නියෝජ්‍ය අමාත්‍ය ඒ. රංජන් රාමනායක මැතිතුමා
රොනල්ඩ් පෙරේරා මැතිතුමා (ජ.නී.)
ජයරාජ් චන්ද්‍රසේකර මැතිතුමා
ගරු කේ.කේ. පියදාස මැතිතුමා
ක්‍රිෂාන්ත ප්‍රසාද් කුරේ මැතිතුමා
ගරු නියෝජ්‍ය අමාත්‍ය සුජීව සේනසිංහ මැතිතුමා
ලසන්ත ගුණවර්ධන මැතිතුමා
රෝසි සේනානායක මැතිතුමිය (හිටපු අමාත්‍ය)
ගරු නියෝජ්‍ය අමාත්‍ය අජිත් පෙරේරා මැතිතුමා
ශාන්තිනී කෝන්ගහගේ මැතිතුමිය (ප.ස.ම.)
ආනන්ද කුලරත්න මැතිතුමා
නීතිඥ ගෞරි තවරාසා මැතිතුමිය